CRI

中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සුභාසර්

蓮花 沈峰

දෙවන කාණ්ඩය - සිව්වන කලාපය




චීනයේ දහතුන් වැනි පස් අවුරුදු සැළැස්ම

පිටුව 2

ජිෂි උත්සවය

පිටුව 11

චීන විප්ලවයට උර දුන් දිළිඳු ගම්මානයක පුනරුදය

පිටුව 22

චීනය එක් දරු ප්‍රතිපත්තියට සමු දෙයි

පිටුව 26

මින්ට් සහිත ලෙමන් යුෂ

පිටුව 35


中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොව්පුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**



No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2373/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ෂාඕ ජී යං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෞං ලී, ලියු හුයි, ෂාඕ ජී යං, චාං යෝ යෝ, හාඕ ලී ෆාං, වං යිං, හැන් ජියැන්, සුන් ජියා ජියා, බූ යුන්, වෙන් ගුවැන් වන්, චන්දන තිලකරත්න, ඩිල්ෂාන් කීර්තිසර, රවිමල් හඳුවල

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


## පටුන


චීනයේ දහතුන් වැනි
පස් අවුරුදු සැළැස්ම 2

චීන කවිය - අවසන් සටන 5

චීන කෙටි කථා
ගස් සෙවණ විකිණීම 7
කොටියා රැවටූ නරියා 9

ජීෂි උත්සවය 11

යෝං හ විහාරය 14

ටිබෙට් ජාතිකයන්ගේ විවාහ චාරිත්‍ර 17

සුළු වෙළඳ භාණ්ඩ
සුපිරි දිව්‍යලෝකය ඊඋ 20

චීන විප්ලවයට උර දුන්
දිළිඳු ගම්මානයක පුනරුදය 22

චීන බැඩ්මින්ටන් ක්‍රීඩක - ලිං තැන් 24

චීනය එක් දරු ප්‍රතිපත්තියට සමු දෙයි 26

ශන්හැයි ජෙයාට්‍රං විශ්ව විද්‍යාලය 28

එදිනෙදා චීන බස 30

ලයිසියම් ජාත්‍යන්තර පාසලේ
චීන සංස්කෘතික ව්‍යාපෘතිය 32

චීන සූප ශාස්ත්‍රය
මින්ට් සහිත ලෙමන් යුෂ 35
අමු මිරිස් සහිත අල තීරු 35

හතරවන ලෝක බෞද්ධ සමුළුව 36

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් -
නිෂ්පූරණය හඳුනා ගැනීම සහ
උගුරේ යමක් සිරවීමකදී ප්‍රථමාධාර 37

# චීනයේ දහතුන් වැනි පස් අවුරුදු සැළැස්ම



ඉදිරිපත් කිරීම : ශී යුයැ

චීනයේ අංගසම්පූර්ණ සැප පහසු සමාජයක් බිහි කිරීමේ පස් අවුරුදු සැළැසුම් ඉලක්කය එළි දැක් වෙයි.

මෙය චීනයේ දහතුන් වැනි පස් අවුරුදු සැළැස්ම වශයෙන් චිනයේ සහස්‍ර සංවර්ධන ක්‍රියාදාමයේ තීරණාත්මක වසර පහක් ලෙසට සැලකේ.

චීනයේ දහතුන් වැනි පස් අවුරුදු සැළැස්ම පිළිබඳ මූලපද 10කි.

## 01 සම්පූර්ණ සැප පහසු සමාජය

එය චීන සිහිනය පිළිබඳ ප්‍රායෝගික පිළිබිඹු වීමකි.

2020 වසර වන විට සැබෑ කර ගැනීමට අපේක්ෂා කෙරේ.

නාගරික වැසියන්ගේ ඒකපුද්ගල ශුද්ධ ආදායම් යුවාන් 18 දහසකි.



ගම්මාන වැසියන්ගේ ඒකපුද්ගල ශුද්ධ ආදායම් යුවාන් 8 දහසකි.

## 02 ආර්ථික වේගය

ඉදිරි වසර පහක් තුළ, චීන ආර්ථිකය මධ්‍යම හා අධික සංවර්ධන මට්ටමක පවත්වා ගනී.









දළ දේශීය නිෂ්පාදිතය සියයට 6.5කි.

2010 වසරේ චීනයේ සමස්ත දළ දේශීය නිෂ්පාදන වටිනාකම යුවාන් ට්‍රිලියන 40.89කි.

2020 වසරේ චීනයේ සමස්ත දළ දේශීය නිෂ්පාදන වටිනාකම් යුවාන් ට්‍රිලියන 80 ඉක්මවා යාමට අපේක්ෂා කෙරේ.

## 03 නිර්මාණශීලිත්ව සංවර්ධනය

නිර්මාණශීලිත්වය රටේ සංවර්ධන කේන්ද්‍රයක් ලෙසට සලකයි.

චීන ආර්ථික ප්‍රතිසංස්කරණය ධාරිතාවේ සිට ගුණාත්මකභාවය වෙත පරිවර්තනය කරයි.

## 04 සාධාරණ සංවර්ධනය

රටේ කාර්මන්ත වැනි දැඩි ශක්තිය තහවුරු කිරීම මෙන්ම රටේ සංස්කෘතිය ඇතුළු මෘදු ශක්තිය ද ඉහළ නංවයි.

නාගරික හා ගම්මාන අතර සාධාරණ සංවර්ධනය තහවුරු කළ යුතුයි

## 05 හරිත සංවර්ධනය



සම්පත් පිරිමැසීම මෙන්ම පරිසර ආරක්ෂා කර ගැනීම චීනයේ මූලික ප්‍රතිපත්තියකි.

## 06 විවෘත සංවර්ධනය

චීන ආර්ථිකය ලෝක ආර්ථිකය හා ගැඹුරු ලෙස සම්බන්ධ වීමේ ප්‍රවණතාව වදගත් කොට සලකා අන්‍යෝන්‍ය යහපත් හා පොදු ජයග්‍රහණය සහිත විවෘත ප්‍රතිපත්තිය ක්‍රියත්මක කරයි.

## 07 පොදු පංගු සංවර්ධනය

සංවර්ධනය ජනතාවට සේවය කළ යුතුයි.

සංවර්ධන ප්‍රතිඵලය ජනතාව තුළින් බෙදා ගත යුතුයි.

පොදු පංගු සංවර්ධනයෙන් ජනතාවට වඩාත් සුබ සෙත සැලසීමට අපේක්ෂා කෙරේ.

## 08 දෙ දරු ප්‍රතිපත්තිය




චීනය එක් දරු නීතිය ඉවතට දමයි.

සෑම පවුලකට දරුවන් දෙදෙනෙකු හදාවඩා ගැනීමට අවස්ථාව හිමි වෙයි.

## 09 පක්ෂ පරිපාලනය

චීන කොමියුනිස්ට් පක්ෂයේ මූලික පරිපාලන වගකීම සංවර්ධනයයි.





චීන ආර්ථික හා සමාජ සංවර්ධනය චීන කොමියුනිස්ට් පක්ෂය විසින් පාලනය කරයි.

ඒ වෙනුවෙන් විවිධ මට්ටමේ චීන කොමියුනිස්ට් පක්ෂ පාලක කණ්ඩායම් සංවර්ධනය ශක්තිමත් කළ යුතුයි.

## 10 දූෂණ මර්දනය

පක්ෂ යහපාලනය හා දූෂණ මර්දනය තවදුරටත් ඉදිරියට ගෙන යයි.

දූෂණ මර්දනයෙන් ලැබූ ජයග්‍රහණය තහවුරු කර ගත යුතුයි.

දූෂණ හා වංචා රහිත රාජ්‍ය සේවා පද්ධතියක් ස්ථාපිත කිරීම අරමුණයි.




# අවසන් සටන

මහ බලයකින්
මම මහ කඳු බිමට සමතලා
කෙලෙමී.
එහෙත් මගේ යහපත් දෛවය
හීන වී ගොසිනි.
මගේ අසු සටන් නොවදී.
අශ්වයා සටන් කලද
නොකලද කම් නැත;
සුන්දරිය කියන්න,
මට ඔබ සමග කළ හැක්කේ
කුමක් ද?



ඉදිරිපත් කිරීම : ලියු හුයි





ශ්‍යාං යු (ක්‍රි.පූ. 232-ක්‍රි.පූ. 202) චීන ඉතිහාසයේ ප්‍රසිද්ධ ජනරාල්වරයෙක්. ඔහු විශිෂ්ඨතම රණශූරයා ලෙස විරුදාවලීය ලැබුවා. පැරණි කාලයේ පළමු වන එක්සත් චීනය බිහි වූ යුගය චින් යුගය ලෙස හැඳින් වෙනවා. චින් යුගයේ අග භාගයේදී අධිරජයා ඉතා ක්‍රෑර ආකාරයට ජනතාව පාලනය කළා. මෙම ක්‍රෑර යුගය අවසන් කිරීමට ඇතැම් ප්‍රාදේශීය ජනරාල්වරුන් කැරළි මෙහෙයුම් ආරම්භ කළා. චින් යුගය අවසන් කිරීමට ඉතා වැදගත් දායකත්වයක් ලබා දී ඇත්තේ මෙම ශ්‍යාං යු නමැති ජනරාල්වරයා. එනමුත් ඔහුට නව අධිරජයා ලෙස පත් වීමට හැකි වුයේ නෑ. තමා අත්පත් කර ගත් ප්‍රදේශවල ක්‍රෑර පාලනයක් ක්‍රියාත්මක කළ ශ්‍යාං යු ජනතා ද්‍රෝහියෙක් ලෙස හඳුන්වනු ලැබුවා. අනෙක් ජනරාල්වරයා වන්නේ ලියු බාං. ඔහු සමග අධිරජ ධුරයට තරඟ වදින්නට ශ්‍යාං යුට සිදු වුණා. අන්තිම සටනේදී ශ්‍යාං යුගේ හමුදාව ඉතාම දුර්වල වුණා. ඔහුගේ හමුදාව ලියු බාංගේ හමුදාව විසින් වට කරනු ලැබුවා. රාත්‍රියක ශ්‍යාං යුට තම උපන් ගමේ ගීතයක් ඇසුණා. එය දුක්මුසු සහ බිය ජනක හඬක්. ඒ හඬ අසමින් තමාගේ සටන් අශ්වයා සහ පෙම්වතිය දෙස හැඟුම්බරව බලමින්, ශ්‍යාං යු මේ කවිය නිර්මාණය කළා.



# ගස් සෙවණ විකිණීම

**ශ්‍රී ලංකාවේ අන්දරේ මෙන්ම බුද්ධිමත්ශූර චරිතයක් චීනයේදීත් හමු වෙයි. ඔහු නස්රුදි-න් හෙවත් අවන්තිය. අවන්ති තමන්ගේ බුද්ධිමත්භාවයෙන් දුප්පත් සහ දුර්වල මිනිසුන්ට උදව් උපකාර ලබා දුන් කතා චීනය පුරාම ජනප්‍රියය. ඒ කතා සෑම එකකම හාස්‍යය සහ හරය එකට මුසු වී තිබේ. මේ එබඳු කතාවකි:**

ශින්ච්යාං උයිගුර් ස්වායත්තයේ ගිම්හාන කාලය ඉතාමත් උණුසුම්. පෝරණුවක් ඇතුළේ ඉන්නවා වගේ. ඇඟෙන් උල්පතකින් වගේ දාඩිය දා-නවා. අධික උණුසුම් කලෙක වුණත් දුප්පත් අයට එළිමහනේදී බර වැඩ කරන විට, විවේක ගන්න තිබුණේ ගස් සෙවණක් පමණයි.

අවන්තිගේ ගමේ පොලී මුදලාලි කෙනෙක් හිටියා. ඔහු මුදලට කෑදර කෙනෙක්. ඔහුගේ නිවස අසල ලොකු ගහක් තියෙනවා. ඒ ගහ යට, දුප්පත් අය දිවා විවේකය ලබමින් ඉන්නවා ඔහු දුටුවා. ඔහු හිතුවා මුදල් උපයා ගැනීමේ වේලාව ඇවිත් කියලා.

'පලයල්ලා! මගේ ගස් සෙවණේ ඉන්න අවසර ලැබුණේ කාගෙන් ද?' පොලී මුදලාලි ඇහුවා.

'අපි වෙළෙඳ සල්පිලට යනවා. අතරමඟදී විවේක ගැනීමට මේ ගස් සෙවණ හම්බ වුණා.' එක් කෙනෙක් කිව්වා.

'විවේක ගන්නවා? බෑ බෑ. පලයල්ලා, පලයල්ලා!'මුදලාලි ගස් සෙවණේ හිටපු කට්ටියට කෑ ගැසුවා.

'මේ පාර, පෞද්ගලික පාරක් නෙවෙයි. ඇයි බැරි?' තව කෙනෙක් මුදලාලිගෙන් ඇහුවා.



'පාර, මහ ජනයාට අයිති වුණාට මේ ගහ මට අයිතියි. මගෙන් අවසරයක් ලැබුණේ නැත්තම් කාටවත් මේ ගස් සෙවණට ඇතුළු වෙන්න බෑ. විවේක ගන්න ඕන නම්, සල්ලි ගෙවන්න.' මුදලාලි උස් හඬින් උත්තර දුන්නා.

'මේකට සල්ලි ඉල්ලන්නේ ඇයි? ඒක මහ පව්කාර වැඩක්.' තව කෙනෙක් කිව්වා.

මේ මොහොතේදී, අවන්ති බූරුවකු පිට පැමිණියා. ඔහු මේ ගස් සෙවණට ඇතුළු වුණා.

'අවන්ති, සල්ලි ගෙවන්න!' මුදලාලි සිනාසෙමින් කිව්වා.

'මොන සල්ලි ද?' අවන්ති ඇහුවා.

'ඔයා ගස් සෙවණේ ඉන්නවා. මේ ගහ මට අයිතියි. ඒ නිසා, මේ ගස් සෙවණ අයිතිත් මටයි. ඔයා සල්ලි ගෙවනවා විතරක් නොවෙයි, ඔයාගේ බූරුවාත් සල්ලි ගෙවන්න ඕන.' මුදලාලි හෙමින් හෙමින් ඊට හේතුව මොකක් ද කියලා අවන්තිට පැහැදිලි කළා.

'මේ විදියට සල්ලි උපයා ගන්න එක අසාධාරණයි. කවුරුත් ඔයාගේ ගස් සෙවණේ නොහිටියොත්, ඔයාට සතයක්වත් නොලැබේවි. මම කියන්නම් වැඩක්. ඔයාට මේ සෙවණ විකිණීමෙන් ලොකු මුදලක් එකපාරටම ලබා ගන්න පුළුවන්.' අවන්ති මුදලාලිට යෝජනා කළා.

'ඉතින්... කවු ද මිළ දී ගන්නේ?' මුදලාලි සැක සහිතව ඇහුවා.

'මම. ඔයා ගාණ කියන්න.' අවන්ති කිව්වා.

'මට මේ ගහ උරුම වුණේ මගේ සීයාගෙන්. ලොකු ගහක්. ඒ නිසා, මේ ගස් සෙවණ මිළදී ගන්න ඕන නම්, රිදී කාසි දාහක් මට ගෙවන්න.' මුදලාලි උත්තර දුන්නා. අවන්ති මුදල් ගෙව්වා.

මේ ගනුදෙනුව සහතික කිරීම සඳහා, ඔවුන් දෙ-න්නා ගිවිසුමක් අත්සන් කළා.



තවත් දවසක, පොලී මුදලාලි ආපසු ගෙදරට එන විට, තම දොරටු අසල විශාල පිරිසක් රැස් වී හිටියා. ඔහුට නිවසට ඇතුළු වන්න බැරි වුණා.

'ඔයාලා මොනවා ද කරන්නේ? මේ මගේ නිවස!' මුදලාලි කෑ ගැහුවා.

'හා හා, මහත්මයා, මම එයාලාට ආරාධනා කළා මගේ ගස් සෙවණේ විවේක ගන්න කියලා.' අවන්ති හෙමින් හෙමින් උත්තර දුන්නා.

'විවේක ගන්න? මේ මගේ දොරටුවයි.' මුදලාලිට කේන්ති ගියා.

'හැබැයි, මේ මගේ සෙවණ. මගේ සෙවණට ඇතුළු වුණොත් සල්ලි ගෙවන්න ඕන.' අවන්ති මුදලාලි දෙස නොබලා කිව්වා.

පොලී මුදලාලිට ආපසු ගෙදරට ගියේ තාප්පයෙන් ගෙවත්තට පැනීමෙන්. දැඩි කෝපයට පත් වූ ඔහු ගහ කපන්න ගියා.

'මේ ගහ කැපුවට කමක් නෑ. හැබැයි, මගේ ගස් සෙවණ සම්පූර්ණ නැත්නම්, ඔයාට වන්දි ගෙවන්න වෙනවා. අනෙක, දැන් මගේ සෙවණ ඔයාගේ මිදුල දක්වා පැතිරිලා. ඔයා ගෙදරට ආපසු යන විට පරිස්සම් වෙන්න. මගේ සෙවණට ඇතුළු වුණොත්, සල්ලි ගෙවන්න ඕන.' අවන්ති අකුරින් අකුරට කිව්වා.

'එහෙනං, මේ සෙවණ මට ආපසු විකුණන්න.' මුදලාලි ඉවසිල්ලෙන් පැවසුවා.

'හොඳයි. රිදී කාසි දෙදාහයි.' අවන්ති ගාණ අවධාරණය කළා.

'මම ඔයාට විකුණුවේ රිදී කාසි දාහකට නෙ.' මුදලාලි ඇත්තටම පැටලුණා.

'ඒ දවල් කාලයේ මිල. දැන් හැන්දෑවයි. සෙවණ විශාල වෙලා. ඒ නිසා, මිල වැඩි වුණා.' අවන්ති පැහැදිලි කර දුන්නා. පොලී මුදලාලි මුදල් ගෙවා ගස් සෙවණ ආපසු ගත්තා.

රෑ වුණාට පස්සේ, පොලී මුදලාලි නින්දට යන්න හිතුවා. හැබැයි, එයාට ලොකු ඝෝෂාවක් ඇහුණා. එයා බැලුවා ඒ මොකක් ද කියලා. එතකොට බූරුවෝ රංචුවක් මිදුලේ ඉන්නවා එයා දැක්කා. අවන්ති සහ ඔහුගේ යාළුවන් එක්ක ගස් සෙවණේ හිටියා.

'අවන්ති, මොකක් ද මේ කරන්නේ?' මුදලාලි ඇහුවා.

'ඇයි මොක ද වෙලා තියෙන්නේ?' අවන්තිට වැටහුණේ නැතුව මෙන් ඇහුවා.

'මම මේ සෙවණ ආපසු මිළදී ගත්තා. ඔබේ බූරුවෝ ඇයි මෙතන ඉන්නේ?' මුදලාලි කිව්වා.


'ඔබ මිළදී ගත්තේ ඉර එළියෙන් ලැබෙන සෙවණ විතරයි. දැන් තියෙන්නේ හඳ එළියෙන් ලැබෙන සෙවණ. ඒක අයිති වන්නේ මට.' අවන්ති හිනා වෙවී කිව්වා.


පොලී මුදලාලි අහස දිහා බලාගෙන අඬන්න පටන් ගත්තා.



අවන්ති ගැන මෙබඳු රසවත් කතා විශාල සංඛ්‍යාවක් තිබේ. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවා කාර්ය මණ්ඩලය ඒ කතා සාගරයෙන් කදිම කතා 30ක් පමණක් තෝරා ඒවා 'චීනයේ අන්දරේ' නමින් ග්‍රන්ථයක් ලෙස ළඟදී පළ කිරීමට සූදානම් වෙයි. ළමා ලපටි ස්ත්‍රී පුරුෂ කාටත් එම කෘතිය මැලිකමක් නැතිව කියවිය හැකි කතා එකතුවක් වනු ඇතැයි යන්න අපේ විශ්වාසයයි. 'චීනයේ අන්දරේ' කෘතිය ළඟදීම බලාපොරොත්තු වන්න.

ඉදිරිපත් කිරීම : ලියු හුයි






# කොටියා රැවටූ නරියා

## 狐假虎威

hú jiǎ hǔ wēi



ඉදිරිපත් කිරීම : ලියු හුයි




මෙය චීනයේ ආප්තෝපදේශ කතාවක්. එහි මූලික චීන පිරුළ, හූ ච්‍යා හූ වෙයි ලෙස කියනවා. වෙනත් චීන පිරුළු වගේම මේ යෙදුමටත් චීන අකුරු හතරක් තිබෙනවා. මෙහි නරියා සහ කොටියා යන සත්ව වර්ග දෙක පිළිබඳව සඳහන් වෙනවා. අපි බලමු, නරියා සහ කොටියා අතර මොනවා ද සිදු වෙන්නේ කියා.

දවසක්, කොටියා මහ කැලේ නිකම් සැරිසරමින් හිටියා. ඌ නරියෙක් දැක්කා. කොටියා වහාම නරියා අල්ලා ගත්තා. නරියා ව තමාගේ දහවල් ආහාරයට ගන්නට කොටියා හිතුවා.

නරියා ඉතා කපටි සතෙක්. ඌ හදිසියේම කොටියාගෙන් බේරෙන්න උපායක්



හිතුවා. ඌ කොටියාට මෙහෙම කිව්වා:

'ඉහල දෙව්ලොවේ අධිරජයා මං මේ කැලෑවේ සත්වයන්ගේ රජු වශයෙන් නම් කර මෙහාට යවා තියෙනවා. නුඹ මාව කනවා නම්, දෙව්ලොවේ අධිරජයා නුඹට දඬුවම් දෙයි.'

කොටියා නරියාගේ කතාව ගැන සැක කළා.

'ඔබ සත්වයන්ගේ රජු කියලා ඔප්පු කරන්න පුළුවන් ද?' කොටියා ඇහුවා.

'නුඹ මගේ කතාවට විශ්වාසයක් නැත්තම් මාත් එක්ක ඇවිදිමු. එතකොට නුඹට තේරෙයි සත්වයන් මට බිය වන ආකාරය.' නරියා කිව්වා.

ඒක හොඳ අදහසක් කියලා කොටියා හිතුවා. ඔහු නරියාගේ පිටිපසින් කැලෑවේ ඇවිදින්න පටන් ගත්තා. කැලෑවේ හාවුන්, එළුවන්, මුවන් ඇතුළු සතුන් ඈතින් එන කොටියා දැක වහාම පැන දිව්වා. නරියාට සතුටුයි. ඔහු කොටියාට මෙහෙම කීවා:

'දැන් නුඹ දැක්කා නෙ. මේ කැලෑවේ සියළුම සතුන් මට බිය වෙන ආකාරය.'

මෝඩ කොටියාට තේරුණේ නැහැ, සතුන් බිය වුණේ තමාට මිස, නරියාට නෙවෙයි කියා. ඌ නරියාගේ කතාව විශ්වාස කළා. කපටි නරියා කොටි කටින් සිය දිවි බේරා ගත්තා. ඒ පමණක් නෙවෙයි, ඌට කොටියාව රවටන්නත් හැකි වුණා. නරියා වගේ තමුන්ගේ පිටිපස්සෙන් සිටින අය ප්‍රයෝජනයට අර ගෙන නිකරුණේ අනුන්ට හිරිහැර කරන පුද්ගලයන් ගැන නම් අපි සෝදිසියෙන් ඉන්න ඕන.



# ජීෂි උත්සවය

## (චීන පෙම්වතුන්ගේ දිනය)



ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං

චීනයේ හත්වන චන්ද්‍ර මස හත්වනදා රාත්‍රිය, සෞම්‍ය කාලගුණයක් සහ මනා ස්වාභාවික සුන්දරත්වයක් පවතින දිනයකි. මෙම අවස්ථාව, ජීෂි උත්සවයයි. මෙය ජීෂෝ උත්සවය හෝ දියණියන්ගේ උත්සවය යනුවෙන් ද හැඳින්වෙයි. මෙම ශෘංගාරාත්මක උත්සවය, චීනයේ 'ආදරවන්තයින්ගේ දිනය' වශයෙන් සැළකේ.

ජීෂි උත්සවය, පැරණි ප්‍රේම කතාවකට සම්බන්ධ ය. දිගු කාලයක් තිස්සේ පැතිර එන මෙම හැඟුම්බර ප්‍රේම කතාව, චීනයේ ජන ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධතම ප්‍රේම කතා හතරෙන් එකකි.

මෙම පැරණි ප්‍රේම කතාවේ ප්‍රධාන චරිත දෙක ගොපල්ලකු සහ සුරංගනාවියකි. කුඩා කාලයේදී, දෙමව්පියන් අහිමි වීම නිසා ගොපල්ලා ජීවත් වූයේ තමාගේ වැඩිමහලු සහෝදරයා සමඟ ය. එහෙත් සහෝදරයා සහ ඔහුගේ භාර්යාව ගොපලු තරුණයාට නිරන්තරවම කරදර කළහ. ඔහුට ජීවත් වීමට සිදු වූයේ මහලු ගවයෙක් සමඟ ය. එක්තරා දිනයකදී, රිදී ගඟේ ස්නානය සඳහා සුරංගනාවියන් හත් දෙනකු පොළොවට පැමිණියහ. ඔවුන් උනා දැමූ රෙදි කඩක් ගැනීමෙන් එය අයත් තැනැත්තිය තමාගේ බිරිඳ බවට පත් කර ගත හැකි බව ගවයා ගොපල්ලාට කිව්වේ ය. ගොපල්ලා ඒ අනුව ක්‍රියා කළේ ය. අනෙක් සුරංගනාවියන් හයදෙනා ආපසු දෙව්ලොව බලා ගියත් තමාගේ රෙදි කඩ අහිමි වූ සුරංගනාවියට ආපසු යා නොහැකි විය. ඇයට කළ හැකි වූයේ ගොපල්ලාගේ සරණ පැතීම පමණයි. ඒ අනුව, ඔවුහු පවුල් ජීවිතයක් ආරම්භ කළහ.

ඔවුන් දෙදෙනාට විවාහ වීමෙන් පසු පුත්‍රයකු හා දියණියක ලැබිණ. මෙම කුඩා පවුල ඉතාමත් ප්‍රීතියෙන් තමන්ගේ ජීවිතය ගත කළහ. මහලු ගවයා මිය යාමට පෙර ගොපල්ලාට නැවත නැවත මතක් කර දුන්නේ තමා මිය යාමෙන් පසු ශරීරයෙන් හම වෙන් කළ යුතු බවයි. හදිසි අවස්ථාවකදී, ගොපල්ලාට මෙම හම පොරවා ගැනීමෙන් සහායක් ලැබිය හැකි බව ද ගවයා පැවසීය. ගවයා මිය යාම, ගොපල්ලාගේ සහ සුරංගනාවියගේ දැඩි ශෝකයට හේතු විය. ඔවුන් දෙදෙනා ඌගේ හම ඉවත් කර ගැනීමෙන් පසු සිරුර කඳු බෑවුමක භූමදාන කළහ.

ගොපල්ලා සහ සුරංගනාවියගේ විවාහය පිළිබඳ දැන ගත් දෙව්ලොවේ අධිරාජයා සහ පෑලදිග සුරපුරෙහි රැජින දැඩි ලෙස කෝප වූහ. සුරපුර රැජින පොළොවට බැස සුරංගනාවිය දෙව්ලොව වෙත ගෙන ආවා ය. තම බිරිඳගේ වියෝගයෙන් ගොපල්ලා කම්පාවට පත් විය. ඔහු ගවයාගේ හම









පොරවා ගැනීමෙන් පසු දරු දෙදෙනාත් සමඟම වලා මතින් දෙව්ලොව බලා පිටත්ව යාමට හැකි විය. ඔහු තම බිරිඳට ලං වත් ම සුරපුර රැජින නැවතත් ඔවුන්ට එරෙහි විය. ඇය තමාගේ හිස පැළඳි රන් කූරක් ගෙන දෙදෙනා වෙන් වෙන සේ අහසේ ඉරක් ඇන්දා ය. සැනෙකින් මහත් වූ රළ නඟිමින් දිව්‍යමය ගංගාවක් මතු විය. ගොපල්ලාත් ඔහුගේ සුරංගනාවියත් එකිනෙකාට ළං විය නොහැකි අයුරින් වෙන් කෙරිණ. ඔවුන් දෙදෙනාට කළ හැකි වූයේ සුරගඟ දෙපස සිට එකිනෙකා දෙස බලා සිටීම පමණි. දෙදෙනා එකිනෙකා දෙස බලමින් වැලපීම ආරම්භ කළහ. දෙදෙනාගේ සැබෑ ප්‍රේමය දුටු දෙව්ලොවේ අධිරාජයා සහ පෑළදිග සුරපුරෙහි රැජින කම්පා වූහ. සෑම වසරකම හත්වන මස හත්වනදා දෙදෙනාට මූණ ගැසීමේ අවසරයක් ලැබිණ. සෑම වසරකම මෙම දිනයේදී, මුළු විශ්වයේම සිටි පොල්කිච්චෝ රැස් වී සුරගඟ හරහා පාලමක් ලෙසින් පේළි ගැසෙති. ගොපල්ලාට සහ ඔහුගේ සුරඟනට දෙපසින් පාලමට නැඟී එකිනෙකා හා එක් වීමට ඉන් පසු හැකි විය.

සෑම වසරකම හත්වන මස හත්වනදා රාත්‍රියේදී, මිදි මැසි හෝ සෙසු පලතුරු මැසි යට, ගොපල්ලා සහ සුරඟනගේ ප්‍රේම බස් ඔබට ද ශ්‍රවණය කළ හැකි වෙතයි කියැවෙයි.

## ජීෂි උත්සවයේ චාරිත්‍ර

ජීෂි උත්සවය සැමරෙන්නේ සෑම වසරකම හත්වන චන්ද්‍ර මාසයේ හත්වනදා රාත්‍රියේ ය. එම අවස්ථාවේදී, තමන්ට මැහුම් වැඩ පිළිබඳ නිපුණතාවක් අයදීමට යෞවනියන්ගේ සිරිතකි. ඉදිකටු සිදුරුවලට නූල් ඇමිණීමෙන් නිපුණතා පරීක්ෂා කිරීමේ ක්‍රියාකාරකම පැවැත්වෙයි. කුඩා භාණ්ඩ සෑදීමේ තරග ද පැවැත්වෙයි. අයැදුම් උත්සවයේදී, කොමඩු සහ පලතුරු මේසයක තැබිය යුතු ය. මෙම උත්සවයේ චාරිත්‍ර චීනයේ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වුවද ඉතාමත් රසවත් ය.

## ජීෂි උත්සවයේ රසවත් ආහාරය ජෝගුවෝ

ජීෂි දිනයේදී, පොල්කිච්චෝ රැස් වී සුරගඟ හරහා පාලමක් ලෙසින් පෙළ ගැසීමට ක්‍රියා කරති. ගොපල්ලාට සහ සුරඟනට දෙපසින් පාලමට නැඟී එකිනෙකා හා එක් වීමට හැකි වනුයේ මෙම දිනයේදී ය. මේ වන විට, මෙම උත්සවය චීනයේ 'පෙම්වතුන්ගේ දිනය' බවට පත් වී තිබේ. පැරණි කාලයේ ජීෂි උත්සවයේ අර්ථය වර්තමානයට වඩා

සරුසාර ය. 'දියණියන්ගේ උත්සවය' යනුවෙන් ද මෙය හැඳින්වෙයි. මෙම දිනයේදී, යෞවනියන් මැහුම් වැඩ පිළිබඳ නිපුණතා ලැබෙන ලෙස ආයාචනා කරති. එම සුරංගනා කතාවේ සඳහන් සුරංගනාවිය සුන්දර මෙන්ම දක්ෂ ය. ඇයට මැහුම් වැඩ සියුම් ලෙස කළ හැකි ය. ඒ නිසා, මෙම දිනයේදී, යෞවනියන් ඇයගෙන් ආයාචනා කරනුයේ මැහුම් වැඩ පිළිබඳ නිපුණතා සහ බුද්ධිය ලබා දෙන ලෙස ය. එමෙන්ම, ඒ මගින් තෘප්තිමත් විවාහයක් ලැබිය හැකි යැයි ද යෞවනියෝ අපේක්ෂාවෙන් සිටිති.

චීන සාම්ප්‍රදායික උත්සවවලින් බහුතරයක අනුභව කළ යුතු ආහාර තිබේ. ඡීෂි උත්සවයේ සාම්ප්‍රදායික ආහාර අතර 'ඡෝගුවෝ' වඩා ප්‍රකට ය. මෙය 'ඡීඡෝගුවෝ' හෝ 'ඡෝ රොටි' යනුවෙන් ද හැඳින්වෙයි. මෙය තෙල්, පිටි සහ සීනි ඇතුළු ද්‍රව්‍යවලින් විවිධ රූප ඇති සුවඳ කුඩා පිටි ආහාරයකි. එහි මතුපිට විවිධ සුබ සලකුණු සිත්තම් දක්නට ලැබේ. මෙම කුඩා පිටි ආහාර වර්ග දහයකට වැඩි සංඛ්‍යාවක් රතු පැහැති නූලක අමුණා වර්ණවත් නූල් රැසකින් ඊට යටින් රැළි දමනු ලැබේ. අනතුරුව, මෙය බිත්තිවල එල්ලා තිබෙන්නේ සැරසිලි භාණ්ඩ වශයෙනි. එසේ නැති නම් මෙය ළමුන්ගේ ගෙලේ පළඳනු ලබන්නේ අතුරුපසක් වශයෙනි.











# යෝං හ විහාරය

චීනයේ අගනගරය වන බෙයිජිං නගරයේ සුප්‍රසිද්ධ ලාමා පන්සලක් පිහිටා තිබේ. එහි චීනයේ ඇති විශාලතම බුද්ධ ප්‍රතිමාව තැන්පත් කර තිබේ. එය ටිබෙටයේ විසූ සත්වන දළයි ලාමා තුමන් විසින් ෂියැංලොං අධිරාජයා වෙත පිරිනැමුණු මීටර 18ක් උසැති, මීටර 8 ක් පළලැති සුදු සඳුන් පිළිමයකි. 1993 වසරේ දී මේ සඳුන් බුදු පිළිමය ගිනස් ලෝක වාර්තා පොතට ද එක් විණ.

බෙයිජිං නගරයේ ලාමා පන්සලේ නිර්මාණ රටාවන් සාමාන්‍ය පන්සලකට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් වෙයි. ඊට හේතුව වන්නේ මුලින් ම මේ ගොඩනැගිලි ඉදි කරනු ලැබුවේ නිල නිවාස පද්ධතියක් ලෙසිනි. 1694 ෂිං රාජ්‍ය යුගයේදී මේ ගොඩනැගිලි නිර්මාණය ඇරඹුණේ රජ වාසළ පණ්ඩකයන්ගේ වාසය සඳහායි. පසුව එය යොං ෂෙං කුමරුන්ගේ මාළිගා සංකීර්ණයයි. එහෙත් සිය මාළිගයට යාබදව ම බෞද්ධ විහාරස්ථානයක් තිබිය යුතු බව සිතූ යොං ෂෙං අධිරාජයා මාළිගා සංකීර්ණයේ කොටසක් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා ලබා දුන්නේ ය.

යොං ෂෙං අධිරාජයාගේ අභාවයෙන් පසු, ඔහුගේ දේහය තැන්පත් කෙරුණේ ද මේ මාළිගා පරිශ්‍රයේ ම ය. අනතුරුව බලයට පැමිණි ෂියැන්ලොං අධිරාජයා මුළු මහත් මාළිගා පරිශ්‍රයම භික්ෂූන් වහන්සේලාට පැවරීය. අධිරාජයාගේ අනුග්‍රහය ලබා දීම සංකේතවත් කරමින් සියළු ගොඩනැගිලි වහල කහ පැහැති උළුවලින් සෙවිලි කෙරිණ. ඒ කාලයේ කහ පැහැති උළු සෙවිලි කිරීමට අවසර හිමිව තිබුණේ අධිරාජයා වෙසෙන මාළිගයන්හි පමණි.

එතැන් සිට යෝං හ විහාරය හෙවත් සාමයේ සහ සංහිඳියාවේ මාළිගාව යනුයෙන් එය නම් කෙරිණ. සාමාන්‍ය ජනතාව අතර ප්‍රසිද්ධියට පත් වූයේ ලාමා පන්සල නමිනි.

1949 වසරේ සිවිල් යුද්ධයත් සමග පන්සල වසා දමා, ගොඩනැගිලි සංකීර්ණය ජාතික සිහිවටනයක් ලෙස නම් කෙරිණ. සංස්කෘතික විප්ලව සමයේ




ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ



එවැනි ජාතික උරුමයන් විශාල වශයෙන් විනාශ කෙරුණ ද අගමැති චෞ එන් ලායි මහතාගේ මැදිහත් වීම නිසා යෝං හ විහාරය ආරක්ෂා විණ. ආගමික කටයුතු උදෙසා විහාරය ජනතාව වෙනුවෙන් යළි විවෘත කෙරුණේ 1981 වසරේ දී ය. දැන් විහාරය වැඳ පුදා ගැනීමට චීන හා විදේශීය බැතිමත්හු විශාල පිරිසක් නිරන්තරව පැමිණෙති.

රුස්ස ගස් හෙවණ අතරින් විහාර සංකීර්ණය කරා සංචාරකයෝ පැමිණි මග කෙළවර වූයේ මහ මළුවකිනි. මළුව කෙළවර විහාර මන්දි-රයකි. මන්දිරය ඉදිරියේ සුවඳි, දුමින් බුදුන් පුදන භක්තිවන්තයෝ ය. පසෙක ඉටි පහන් දල්වන්නෝ වෙති.

මෙම විහාර මන්දිරය පිටුපස තවත් මළුවක් තිබේ. ඒ මළුව කෙළවර තවත් විහාර මන්දිරයකි. ඊට පිටුපසින් තවත් මළුවක් තිබේ. ඒ ආකාරයට විහාර මන්දිර පහක් ද ඒ ඉදිරියේ මළු පහක් ද ඇත. මළුවෙන් මළුවට දිග පළල ක්‍රම ක්‍රමයෙන් කුඩා වෙයි. විහාර මන්දිර ක්‍රම ක්‍රමයෙන් විශාල වෙයි.


මුල් කාලයේ විහාරස්ථානයෙහි ප්‍රවේශය වූයේ දේවරාජ ශාලාවයි. වත්මන් ප්‍රවේශය වන සාම ප්‍රඥප්ති දොරටුව නිර්මාණය කෙරුණේ පසු කලකදීය. දේවරාජ ශාලාව මැද මෛත්‍රී බෝසතුන්ගේ පිළිමයකි. දෑළේ දිව්‍යරාජයන් සිව් දෙනකි. ඒ ලෝක පාලන දෙවිවරු වෙති. දුවො වෙන්, ත්සේං ත්සං, ත්ච් ගුවො හා ගුවං මු යන මේ දෙවිවරු සිව් දිසා භාරව ධර්මය ආරක්ෂා කරති.

අතීත වර්තමාන සහ අනාගත බුදුවරුන්ගේ පිළිම තැන්පත් කර ඇති සාමයේ හා සංහිඳියාවේ ශාලාව ඇත්තේ ඉන් පසුවය. තුන් බුදු පිළිම වහන්සේලා අභියස මහා ශ්‍රාවකයින් 18 දෙනාගේ පිළිම තනා තිබේ. එම ශාලාවේ පුරාණයේ යොං ෂෙං අධිරා-













ජයා අමාත්‍ය මණ්ඩල සාකච්ඡා පැවැත්වූ බව සඳහන් වෙයි.

ඊළඟ මළුව කෙළවර ඇත්තේ “සදාරක්ෂිත” මන්දිරයයි. එහි තිබෙන්නේ භෛෂජ්‍යගුරු බුදුන් වහන්සේගේ පිළිමයකි. එක් අතකින් ඔසු බඳුනක් රැගත් භෛෂජ්‍යගුරු බුදුන් වහන්සේ චීන බෞද්ධයින් අතර ඉමහත් වන්දනාවට පාත්‍ර වෙයි.

මන්දිරයෙන් එළියට පවිසෙද්දී ම සුවඳ දුමින් සිත පිරී යයි. හැම මළුවක ම ඇති සුවඳ දුම් දල්වන විශාල බඳුන් වටා බැතිමතුන් පිරී ඉතිර ගොසිණි. ඔවුහු සඳුන් කූරු අතැතිව තමන්ගේ වාරය එන තුරු බලා සිටිති. වාරය පැමිණි කල්හි සඳුන් කූරු දල්වා තෙවරක් නැමී වන්දනා කොට සුවඳ දුම් බඳුනෙහි සිටුවති.

# ටිබෙට් ජාතිකයන්ගේ විවාහ චාරිත්‍ර



ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං

සෑම ජාතිකයකුටම තම තමන්ගේ චාරිත්‍ර තිබේ. ඒවාවලින් විවාහ චාරිත්‍ර ඉතා වැදගත් ය. ස්වකීය ජාතියේ අනන්‍යතාව ඉන් මනාව පිළිබිඹු වෙයි. චීනයේ ටිබෙට් ජාතිකයන්ගේ විවාහ චාරිත්‍ර කෙසේ ද යන්න අපි විමසා බලමු.

## 1. කේන්දර හුවමාරු කිරීම

සාමාන්‍යයෙන්, විවාහ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර තරුණයා සහ තරුණිය යන දෙපක්ෂයේ පවුල් දෙක කේන්දර හුවමාරු කරති. ජ්‍යෝතිෂය දන්නා කෙනෙක් කේන්දර දෙක ගැලපේ ද යන්න බලයි.

## 2. විවාහ යෝජනාව ඉදිරිපත් කිරීම

කේන්දර දෙක ගැලපුණහොත්, මනමාලයාගේ පැත්ත මනමාලි පැත්තට නිළ වශයෙන් විවාහ යෝජනාව ඉදිරිපත් කරන්නේ හාදා නමැති සුදු පැහැති සළුවක් ගැනීමෙන් පසුව ය.

## 3. විවාහ ගිවිස ගැනීම

දෙපක්ෂය මෙම විවාහයට එකඟ වුණොත්, විවාහ ගිවිස ගැනීමේ සහතික පත්‍රයක් අත්සන් කරති. සාමාන්‍යයෙන්, මෙම සහතික පත්‍රය ලියන්නේ කවි ආකාරයෙනි. දෙපක්ෂය අතර අන්‍යෝන්‍ය ආදරය සහ ගෞරවය, වැඩිහිටියන්ට මනාව සැළකීම ඇතුළු කරුණු ඊට ඇතුළත් ය. මෙම සහතික පත්‍රය අත්සන් කරන දිනයේ වැය කරන සියළු වියදම මනමාල පැත්ත භාර ගත යුතු ය. මනමාල පැත්ත



මනමාලි පැත්තේ සෑම කෙනකුට හාදා සළුවක් පිරිනමයි. එමෙන්ම මනමාලියගේ දෙමව්පියන්ට තුටු පඬුරු ලබා දෙයි. ඒ මනමාලියගේ දෙමව්පියන් තමාගේ දියණිය ඇතිදැඩි කිරීම සඳහා වෙහෙස මහන්සි වීම වෙනුවෙනි.

එමෙන්ම මනමාලියගේ මවට චීප්‍රනයක් තෑගි දීමත් තවත් සිරිතකි. එවැනි තෑග්ගක් ලබා දෙන්නේ දියණිය උස්මහත් වන තුරු ආහාර පිස දීමේදී චීප්‍රන විශාල සංඛ්‍යාවක් ඇය භාවිත කර තිබීම හේතුවෙනි.

මෙම උත්සවයට මනමාලයා සහ මනමාලිය සහභාගි නොවෙති. දෙපක්ෂයේ පවුල් සාමාජිකයෝ සහභාගි වෙති. මෙම උත්සවය අවසන් වන විට, මනමාලි පැත්ත හුවමාරුවක් වශයෙන් මනමාල පැත්තට හාදා සළු පිරිනමයි.

## 4. විවාහයට පෙර

විවාහ උත්සවයට පෙර, මනමාලි පක්ෂය මනමාල පක්ෂයට දෑවැද්ද ලබා දෙන්නේ සුබ නැකතට අනුව ය. මෙම දෑවැද්ද අතරින් භාණ්ඩ තුනක් අනිවාර්යෙන්ම තිබේ. බෝධිසත්වයන්ගේ තඹ පිළිමයක් ඒවාවලින් එකකි. තව දෙකක් වනුයේ බෞද්ධ ග්‍රන්ථයක් සහ බුදු දාගැබ් ආකෘතියකි. පැරණි චීනයේ ටාන් රාජ පෙළපතේ වෙන් චෙන් කුමාරිය ටිබෙටයේ තුබෝ රජු සොන්සාන් ගාම්පෝ හා විවාහ වන්න මෙම භාණ්ඩ තුන ගෙන ආ නිසා, මේ, ටිබෙට් ජාතිකයන්ගේ විවාහ චාරිත්‍රයක් බවට පත් වී තිබේ.

විවාහයට කලින් දිනයේදී මනමාලයා මනමාලියගේ විවාහ ඇඳුම් හා පැළඳුම් සූදානම් කර මනමාලි පැත්තට යවයි.

## 5. විවාහ දිනය

විවාහ දිනයේ උදෑසන, මනමාල පාර්ශ්වයේ ප්‍රභූ ඥාතියකුගේ ප්‍රමුඛ කණ්ඩායම මනමාලියගේ නිවසට පිටත්ව යයි. මෙම කණ්ඩායම සමඟ ගැබ්බර වෙළඹක් කැඳවා ගත යුතු ය. මෙම වෙළඹගේ පැහැය, මනමාලියගේ උපන් රාශියට අනුකූල විය යුතු ය. මෙම කණ්ඩායම මනමාලි පැත්තට පැමිණ කුඩා කැඩපතක්, වටිනා මැණික් සහ ආභරණ සහිත ඊතලයක් මනමාලියගේ පිටෙහි සවි කරයි. ඇය මනමාල පාර්ශ්වයට අයිති වන බව ඉන් සංකේත වෙයි.

මනමාලිය මෙම කණ්ඩායම සමඟ ආපසු මනමාල පැත්තට යන්නේ එක් ඥාතියකුගේ නායකත්වයෙනි. මනමාලිය සිය නිවසෙන් පිටත්ව යන විට, අප නිවසේ වාසනාව ගෙනි යා නොයුතු බව ඥාතියෙක් දැතින් ඊතලයක් සහ එළු කකුලක් අරගෙන උස් හඬින් කෑ ගැසිය යුතු ය.

මෙම කණ්ඩායම ආපසු යන අතරමඟදී, ජලය

හෝ දර පිටෙන් දරාගෙන සිටින කෙනකු මුහුණ ගැසුණොත් සුබයි කියා හිතේ. ඔහුට හාදා සළුවක් පිරිනැමිය යුතු ය. හිස් පැසක් දරාගෙන සිටින කෙනකු හෝ ලෙඩකු හෝ මුහුණ ගැසුණොත් අසුබයි කියා හිතේ. විවාහ උත්සවයෙන් පසු, ඒ අසුබ තත්වය පළවා හැරීමට ලාමාවරුන්ට නිවසට ආරාධනා කළ යුතු ය. උන් වහන්සේලා විසින් සෙත් ශාන්තියක් සිදු කරති.

මනමාලිය පැමිණීමට පෙර, මනමාල පැත්ත පාපිස්සක් සුදානම් විය යුතු ය. මෙම පාපිස්ස, තිරිඟුවලින් සහ සානු බාර්ලිවලින් පිරී තිබෙන පැසක් වෙයි. ඒ මත වර්ණවත් සේද රෙද්දක් තියා ගනියි. එමෙන්ම, තිරිඟුවලින් සුබ සලකුණක් සකස් කරයි.

මනමාලිය මනමාල නිවසට පැමිණීමට තව චාරිත්‍ර රැසක් තිබේ. වෙළඹෙන් බැසීම, නිවාස දොරට පිවිසීම, කාමරයට පිවිසීම, දෙමව්පියන්ට සැලකීම ඇතුළු අවස්ථාවලදී ටිබෙට් ජාතිකයන්ගේ ගී හඬ නැඟේ. එමෙන්ම, හාදා සළු භාවිත කෙරේ.

සාමාන්‍යයෙන් විවාහ උත්සවය දින තුනක් පුරා පැවැත්වෙයි. මෙම දින තුනේදී නෑදෑ මිතුරන්ට ඊට සහභාගි විය යුත්තේ තෑගි සහ හාදා සළු අරගෙන. මෙම නෑදෑ මිතුරන්ට සංග්‍රහය කරන්නේ මනමාල පැත්ත විසිනි. මනමාලිය ඊට එක් නොවෙයි.





# සුළු වෙළඳ භාණ්ඩ සුපිරි දිව්‍යලෝකය ඊඋ

ඊ උ යනු චීනයේ චැ පියන් පළාතේ පිං හුආ නගරයට අයත් කෝළරයක්. ඊ උ ඓතිහාසික ප්‍රදේශයක්. චීන ඉතිහාසයේ විවිධ යුගවල ඊ උ කෝළරයේ ප්‍රකට අය බොහොමයක් ජීවත්වීම ඊට හේතුවයි. උදාහරණ ලෙස ටං අධිරාජන යුගයේ අතිදක්ෂ කවි ලුවෝ බිං වන්, සුන්ග් යුගයේ ප්‍රකට ජනරාල් සොන් සැ, යුවැන් යුගයේ ජනප්‍රිය වෛද්‍යවරුන් 4 දෙනෙකුගෙන් එකක් වන චු තැන් ශී ඇතුළු ඉතිහාසයේ කීර්තිමත් පුද්ගලයන් ඊ උ කෝළරයේ ජන්ම ලාභය ලබා තිබේ. එහෙත් වර්තමාණයේ ඊ උ කෝළරය ප්‍රසිද්ධ වී තිබීමේ හේතුව ඊට වඩා වෙනස්ය.

ඇමෙරිකාවේ ප්‍රකට ව්‍යාපාරික සඟරාවක් වන ෆොබ්ස් සඟරාව 2013 වසරේ නිකුත් කළ වාර්තාවකට අනුව චීනයේ සමෘද්ධිමත්ම කෝළර 10කින් ප්‍රථම ස්ථානය ඊ උ කෝළරයට හිමි වෙයි. පෞද්ගලික ආදායම හා පෞද්ගලික සුබෝපභෝගී රථ හිමි කරගත් ප්‍රමාණය පිළිබඳ චීන මහ ගොඩබිමේ කෝළරවලින් අනුපිළිවෙල අනුව ප්‍රථම ස්ථානය ඊ උ වලට හිමිවෙයි. වර්තමාණයේදී ඊ උ හා රටවල් මෙන්ම ප්‍රදේශ 219ක් අතර ආර්ථික හා වෙළඳ කටයුතු සිදු කරන අතර සෑම වසරක ම විදේශ ව්‍යාපාරිකයන්ගේ ගමන්වාර ලක්ෂ 4ක් මෙම ප්‍රදේශයට සිදු වෙයි. මේ ප්‍රදේශය මෙතරම් සමෘද්ධිමත් වුයේ කෙසේ ද? මෙම ප්‍රදේශයට මෙතරම් විදේශ ව්‍යාපාරිකයන් එන්නේ ඇයි?

ඊ උ ලෝකයේ සුළු වෙළඳ භාණ්ඩ මිලදී ගත හැකි විශාලතම මධ්‍යස්ථානය බවට පත් වීම ඊට හේතුවයි. ඊ උහි පිහිටවා ඇති සුළු වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව යනාදී අධිකාරී ආයතන විසින් ලෝකයේ විශාලතම සුළු වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ ලෙස නම් කර තිබේනවා.

ඊ උ ජාත්‍යන්තර ව්‍යාපාරික වෙළඳ සංකීර්ණය, බිං වන් වෙළඳ පොළ හා හුවන් යුවන් වෙළඳ පොළවලින් ඊ උ සුළු වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ සමන්විත වී තිබේ. එහි ඇති සාප්පු සංඛ්‍යාව 70 දහසකට අධිකය. එම සාප්පුවල අලෙවි කරනුයේ ක්ෂේත්‍ර 34ක වෙළඳ භාණ්ඩයි. එයට කලා අත්කම්, යකඩ වැඩ, ඇඳුම් පැළඳුම්, ක්‍රීඩා භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය, සිල්ලර යනාදී සියලු කර්මාන්ත පරිභෝජක භාණ්ඩ අතුලත් වෙයි. ඒ අතරින් සැරසිලි භාණ්ඩ, මේස් හා සෙල්ලම් භාණ්ඩ අලෙවි ප්‍රමාණය රටේ සමස්ථ ප්‍රමාණයෙන් තුනෙන් එකකි. තොග භාණ්ඩ වෙළඳ පොළසැල හේතුවෙන් ඊ උ සුළු වෙළඳ





භාණ්ඩ වෙළඳ පොළේ අලෙවි භාණ්ඩ ලාභ මෙන්ම විවිධ වර්ගවලින් ලබා ගත හැකිය. එම නිසා මෙහි අලෙවි භාණ්ඩ ජාත්‍යන්තර වෙළඳ පොළේ දැඩි තරගකාරීය.

රටවල් හා ප්‍රදේශ 219කට ඊ ඌ සුළු වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ බලපෑම් සිදු කළ හැකිය. අග්නිදිග ආසියාවේ, මැද පෙරදිග ප්‍රදේශයේ හා යුරෝපයේ ඇතුළු ප්‍රදේශවල ඊ ඌ සුළු වෙළඳ භාණ්ඩ දැකිය හැකිය. වසරක භාණ්ඩ අපනයන ප්‍රමාණය සමස්ත අලෙවි ප්‍රමාණයෙන් 50%කි. කලා අත්කම්, සැරසිලි, කණ්ණාඩි යනාදී තරගකාරී කර්මාන්තවල භාණ්ඩ අපනයන ප්‍රමාණය අදාළ කර්මාන්තවල සමස්ත අලෙවි ප්‍රමාණයෙන් 70%කට වැඩිය. දැනට ඊ ඌ කෝළරයේ දිගුකාලීනව වෙසෙන ව්‍යාපාරිකයන් 13 දහසකට වැඩි පිරිසක් සිටින අතර විදේශ ව්‍යාපාරික කටයුතු ආයතන 200කට වැඩි ප්‍රමාණය තිබේ. 2002 වසරේ චීන වාණිජ අමාත්‍ය ෂී ග්වන් ෂැන්ග් මැතිතුමා ඊ ඌහි සංචාරයක නිරත වන විට ඔහු පැවසුවේ ඊ ඌ සුළු වෙළඳ භාණ්ඩ ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ බවයි. එයින් අපිට දක්නට ලැබෙන්නේ ජාත්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ ඊ ඌ වලට විශාල ජයග්‍රහණයක් ලබා ගෙන තිබෙන බවයි.


වෙළඳ කර්මාන්තය සම්පූර්ණ වීමට ඊ ඌහි ලෝක පරාසය වන ජාත්‍යන්තර බඩු ප්‍රවාහන පද්ධතිය ස්ථාපිත කරමින් පවතී. ඊ ඌ රේගු දෙපාර්තමේන්තුව හා නිං බෝ නගරයේ මෙන්ම ශං හයි නගරයේ වරාය අතර පහසු ලෙස රේගු ක්‍රමයක් ස්ථාපිත කර තිබේ. මෙවන විට ලෝකයේ ප්‍රසිද්ධ මුහුදු ප්‍රවාහන සමාගම් 18ක් ඊ ඌහි කාර්යාල ගොඩනගා ඇත. පරිපූර්ණ ප්‍රවාහන පද්ධතියක් තිබේ නම් භාණ්ඩ පිරිවැය වියදම අඩු විය හැකිය. විදේශ ව්‍යාපාරිකයන් ඊ ඌ වලට පැමිණෙන්නට හේතුවලින් එකක් වනුයේ මෙයයි.

ඊ ඌහි චීන ජාතික මට්ටමේ සංවර්ධන මධ්‍යස්ථාන රැසක් ස්ථාපිත කර තිබේ. එහි ජාතික මට්ටමේ කර්මාන්ත මධ්‍යස්ථාන 13ක්, ජාතික මට්ටමේ ආර්ථික සංවර්ධන පුරයක්, පළාතේ මට්ටමේ කාර්මික මධ්‍යස්ථානයක් පිහිටයි. මේ අතර ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාරය ඊ ඌහි වේගයෙන් සංවර්ධන වෙමින් පවතී. මෙවන විට ඊ ඌහි විවිධ ක්ෂේත්‍රවල ඉලෙක්ට්‍රොනික් වෙළඳසැල 50 දහසකට වැඩි ප්‍රමාණය තිබේ. ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාරය අනාගතයේ ප්‍රධාන ව්‍යාපාරයක් වීම හේතුවෙන් ඊ ඌ එය වෙත දැඩි අවධානය යොමු කරයි. එයින් ඉදිරියේදී ඊ ඌ සුළු වෙළඳ භාණ්ඩ වෙළඳ පොළ තවත් යහපත් තරගකාරීත්වයක පවතිනු ඇත.

ඊ ඌ යනු ඉතා ම සමෘද්ධිමත් වෙළඳ සංකීර්ණ කෝළරයකි. ජාත්‍යන්තර මෙන්ම විවෘත කෝළරයක් සහ සුපිරි බලය සහිත කෝළරයකි.







ඉදිරිපත් කිරීම : වෙන් ගුවැන් වන්

# චීන විප්ලවයට උර දුන් දිළිඳු ගම්මානයක

# පුනරුදය

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං



ලේ චියා යිං ස ගම්මානය පිහිටා තිබෙන්නේ ඇතුළු මොංගෝලියාවේ කා ලා පිං කෝරළයේ ය. එම ගම්මානය විප්ලවයට උර දුන් කඳුකර දිළිඳු ගම්මානයකි. එහෙත් මෑත වසර කිහිපය තුළ ගම්මානය නගා සිටුවා තිබේ. එහි නව ජන නිවාස සංකීර්ණ නිසා පිළිවෙළින් පිහිටුවනු ලැබිණ. එමෙන්ම නව හා පිරිසිදු මහා මාර්ග සහ අලංකාර වෘක්ෂලතාවන් තැන් තැන් වල දැකිය හැකිය.

ලේ චියා යිං ස ගම්මානයේ පුනරුදයට හේතුවූයේ චීනය නව ගම්මාන සංවර්ධනය කිරීමේ හා "දස පාර්ශ්වීය පූර්ණ ආවරණය" නමැති ප්‍රතිඵලදායී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසාය.

ලේ චියා යිං ස ගම්මානය පසුගිය කාලයේ පිටිසර බද කුඩා කඳුකර ගම්මානයකි. එහි ගමනාගමනය දුෂ්කරය. මහා මාර්ග විවෘත වීතිබුනේ නැත. වැසි හා හිම කාලවල කරත්තයක් පවා ගමන් කිරීම අසීරු වුනා. එමෙන්ම ගම්මානයේ වැසියන්ගේ ජීවිතයේ හා නිෂ්පාදනයේ තාක්ෂණ භාවිතයක් සිදු වුයේ නැත.

මෑත වසර කිහිපය තුළ චීනය "දස පාර්ශ්වීය පූර්ණ ආවරණය" නමැති ප්‍රතිඵලදායී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් සමඟ ම ලේ චියා යිං ස ගම්මානයේ විශාල විපර්යාසයක් සිදු ව තිබේ. වර්තමානයේ එම ගම්මානය ප්‍රධාන මහා මාර්ගවලට විවෘත වී තිබේ. එහි පානීය ජල ව්‍යාපෘති සහ වෙනත් ජල සම්පාදන ක්‍රම ආරම්භ කොට තිබේ. ගම්මානයේ පැරණි හා කැඩී බිඳී ගිය නිවාස අලුත්වැඩියා කර ගොවියන්ට විනෝද මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇත. විදුලි, ගුවන් විදුල හා රූපවාහිනී සංඥා සහ ජංගම සංනිවේදනය සමස්ත ගම්මානයට ආවරණය වෙයි. එහි වැසියන්ගේ දෛනික සේවා,වෙළඳ භාණ්ඩ මිළදී ගැනීම හා විනෝදාංශ විශාල පරිමානයෙන් ඉහළ නැංවා තිබේ.

වත්මන් ලේ චියා යිං ස ගම්මානය දිළිඳු ජීවිතයෙන් මුදා ගෙන තිබේ. ගම්මානය ග්‍රාමීය සංචාරය සහ කැලෑ හා ඇපල් ගස් වැවීම යනාදි ප්‍රධාන කර්මාන්ත පුළුල් ලෙස සංවර්ධනය කරයි. එම ගම්මානය කුඩා ගම්මානයක් වුවද එහි අලංකාර ස්වාභාවික දර්ශන තිබේ. එවගේ ම එහි විවිධ වර්ගවල වටිනා පැළ හා සම්පත් ප්‍රමාණයක් තිබේ. ලේ චියා යිං ස ගම්මානය ව්‍යාපෘති සංවර්ධනය, එහි විශේෂ ලක්ෂණ සහිත ස්වාභාවික දර්ශන, ඓතිහාසික සම්ප්‍රදාය සහ සංස්කෘතික උරුමය සමීපව ඒකාබද්ධ කො තිබේ. එහි ඇති වඅැන්

ගුවෝ සොහොන්බිම් ඇතුළු පැරණි සංස්කෘතික නෂ්ටාවශේෂ ගැඹුරු ලෙස කැණීම් සිදු කර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට පියවර ගෙන තිබේ.

වසර 2015 අවසන් වන විට, ලේ චියා යිං ස ගම්මානයේ වර්ග මීටර් ලක්ෂ 80ක ගොවිබිමේ සම්පූර්ණයෙන් ඇපල් ගස් වැවීම ඉලක්කයයි. මේ වන විට, සංචාරක කර්මාන්තයට එක් වන ගොවියන්ගේ සංඛ්‍යාව ගම්මානයේ සමස්ත ගොවියන්ගේ ප්‍රමාණයෙන් 30%කි. නටඹුන් නැරඹීම, සංචාරය හා නිවාඩු ගත කිරීම සහ වනාන්තරවල පිහිටවූ ඖෂධීය සම්බාහන මධ්‍යස්ථාන ආශ්‍රිත ග්‍රාමීය සංචාරක කර්මාන්ත මාලාවක් එම ගම්මානයේ නිර්මානය කර තිබේ.

චීනය "දස පාර්ශ්වීය පූර්ණ ආවරණය" නමැති ප්‍රතිඵලදායී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ගොවියන්ගේ ආකල්ප සහ ජීවන තත්වයේ විශාල විපර්යාසයක් සිදු කර තිබේ. එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවන ක්‍රමයේ සහ නිෂ්පාදන ආකාරයේ නව විපර්යාසයක් සිදු වීතිබේ. ග්‍රාමීය වැසියෝ ගම්මානයේ සංවර්ධනයට සක්‍රීය ලෙස එක් ව සිටිති.

වර්තමානයේ ලේ චියා යිං ස ගම්මානයේ හැම තැනක ම නව හා අලංකාර දර්ශන දැකිය හැකියි. ඈතීතයේ දිළිඳු බව නැති වී තිබේ. එහි යටිතල පහසුකම් යහපත් කොට මහජන සෙවා හැකියාව ඉහළ නැංවීමට එහි ග්‍රාමීය සංචාරක කර්මාන්ත සංවර්ධන ස්ථීර පදනමක් කොට ගෙන තිබේ. සංස්කෘතික නෂ්ටාවශේෂ කැණීම් සහ ආර්ථික කැලෑ පුළුල් ලෙස වැවීම ග්‍රාමීය සංචාරක කර්මාන්ත වැඩිදුර සංවර්ධනය ඉදිරියට මෙහෙයවා ඇත. "දස පාර්ශ්වීය පූර්ණ ආවරණය"යන ප්‍රතිපත්තිය ලේ චියා යිං ස ගම්මානයේ වැසියන්ගේ ප්‍රායෝගික සුභ සාධනය බවට පත් වී තිබේ.

චීන විප්ලවයට උර දුන් දිළිඳු ගම්මානයක් වන ලේ චියා යිං ස ගම්මානය නගා සිටුවීමේ මාර්ගයේ ස්ථීර පියවරක් ගෙන තිබේ. දැන් එය චීනයේ තවත් සුන්දර ගම්මානයක් බවට පත් වී ඇත.












# චීන බැඩ්මින්ටන් ක්‍රීඩක ලිං තැන්

ලිං තැන්, චීනයේ සුප්‍රකට බැඩ්මින්ටන් ක්‍රීඩකයෙක්. 1983 වසරේ ඔක්තෝබර් මාසයේ 14වැනිදා ඔහු ඉපදුණේ චීනයේ ෆු පිඇන් පළාතේ ය. 1988දී ඔහු බැඩ්මින්ටන් ක්‍රීඩා කිරීමට පටන් ගන්නා විට ඔහුගේ වයස අවුරුදු පහකි. ආධුනික පන්තියේ වම් අතින් බැඩ්මින්ටන් ක්‍රීඩා කළ දරුවෙකට හිටියේ ලිං තැන් පමණයි. එම නිසා ඔහු පුහුණුකරුවාගේ අවධානයට ලක් විය. වසර හතරකින් පසුව 1992 වසරේ ඔහු ෆු පිඇන් පළාතේ ක්‍රීඩා පාසලට ඇතුළ් විය. 1995 වසරේ ලිං තැන් සමස්ත චීනයේ තරුණයන්ගේ බැඩ්මින්ටන් තරඟයේ ශූරතා බවට පත් විය. ඊට අමතරව ඔහු චීන මහජන විමුක්ති හමුදාවේ බැඩ්මින්ටන් කණ්ඩායමට ඇතුළත් විය. එහිදී ලිං තැන් හමුදා භටයන් සමග පුහුණුවට යොදා තිබේ. 2000 වසරේ ඔක්තෝබර් මාසයේ ලිං තැන් චීන ජාතික බැඩ්මින්ටන් කණ්ඩායමට ඇතුළත් විය. 2002 වසරේ අගෝස්තු මාසයේ ජාත්‍යන්තර බැඩ්මින්ටන් සංගමය විසින් සකස් කළ ලෝකයේ බැඩ්මින්ටන් ක්‍රීඩකයන්ගේ වර්ගීකරණයේ ලිං තැන් ප්‍රමුඛ ස්ථානයට පත් විය. 2005 වසරේ දෙසැම්බර් මාසයේ චීනයේ පැවති ලෝක බැඩ්මින්ටන් කුසලාන තරඟයේ අවසාන තරඟයේදී ලිං තැන් ඔහුගේ ප්‍රථම ලෝක ශූරතාව දිනා ගත්තේ ය. 2006 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති ලෝක බැඩ්මින්ටන් ශූරතාවලියේ ලිං තැන් ජයග්‍රහණය ලබා ගත්තේ ය. 2008 වසරේ චීනයේ බෙයිජිං අගනුවර පැවති ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ ලිං තැන් බැඩ්මින්ටන් තරඟයේ රන් පදක්කම් දිනා ගත්තේ ය. ඉන් පසුව 2010 වසරේ නොවැම්බර් මාසයේ චීනයේ ගුවන් චෞ නගරයේ පැවති ආසියානු ක්‍රීඩා උළෙලේදී ඔහු යළිත් ජයග්‍රහණය ලබා ගෙන මෙවර උළෙලේ අතිශය වටිනා ක්‍රීඩකයා බවට පත් විය. ඒ මෙන්ම 2010 වසරේ ඔහු ජාත්‍යන්තර විශිෂ්ට ක්‍රීඩකයන් දසදෙනාගෙන් එක් අයෙකු බවට පත් විය. 2012 වසරේ බ්‍රිතාන්‍යයේ ලන්ඩන්හිදී පැවති 30වැනි ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ ලිං තැන් නැවත රන් පදක්කමක් දිනා ගත්තේ ය. එවිට ලිං තැන් බැඩ්මින්ටන් ඉතිහාසයේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල, ලෝක බැඩ්මින්ටන් ශූරතාවලිය, ලෝක බැඩ්මින්ටන් කුසලාන තරඟය, ආසියානු ක්‍රීඩා උළෙල සහ ආසියානු බැඩ්මින්ටන් ශූරතාවලිය යන ලෝක බැඩ්මින්ටන් තරගවල ජයග්‍රහණය දිනා ගත් එකම ක්‍රීඩකයා බවට පත් වී තිබේ. එමෙන්ම මෙම වසරේ ඔහු Forbes සඟරාවෙ තොරා ගත් චීනයේ කීර්තිමත් පුද්ගලයන්ගේ ලැයිස්තුවට ඇතුළත් විය.

ලිං තැන්ගේ බිරිඳ ද චීනයේ සුප්‍රකට ක්‍රීඩිකාවකි.

ඔවුන් දෙදෙනා ප්‍රේමයෙන් බැඳුනේ 1997 වසරේදී ය. 2010 වසරේ දෙසැම්බර් මාසයේ 13වැනිදා ඔවුහු විවාහ වූහ. 2011 වසරේ ජූනි මාසයේ ලිං තැන්ගේ ඉටිරූපය ශන්හයි නගරයේ පිහිටි Madame Tussauds ඉටිරූප කෞතුකාගාරයට ඇතුළත් විය. ඒ වන විට ලිං තැන් ඉටිරූප හිමි චීනයේ ක්‍රීඩකයන් අතලොස්සෙන් එක් අයෙක් බවට පත් විය. 2012 වසරේ ඔක්තෝබර් මාසයේ 17වැනිදා ලිං තැන් හු පිඅැන් පළාතේ විශ්ව විද්‍යාලයක පාශ්චාත් උපාධිය ලබා ගත්තේ ය. ඒ නිසා ඔහු චීන ජාතික බැඩ්මින්ටන් කණ්ඩායම තුළ පාශ්චාත් උපාධිය ලබා ගත් එකම ක්‍රීඩකයා බවට පත් විය. ලිං තැන් ස්වකීය චරිතාපදානය රචනා කළේ ය. එම චරිතාපදානය නම් කර ඇත්තේ ලෝකයේ කෙළවර තෙක් යනුවෙනි.

ප්‍රතිවිරුද්ධ කණ්ඩායමට එරෙහිව ඔහු ශ්‍රේෂ්ඨම ක්‍රීඩකයා යැයි බ්‍රිතාන්‍යයේ පුවත්පත ලිං තැන් The Guardian ප්‍රශංසාවට ලක් කළේ ය. ඔහු ලෝක ශූරතා හතරක් දිනා ගත්තේ ය. ඒ මෙන්ම 2008 වසරේ චීනයේ බෙයිජිං අගනුවර පැවති ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ බැඩ්මින්ටන් තරඟයේ ඔහු මැලේසියාවේ බලවත්ම බැඩ්මින්ටන් ක්‍රීඩකයා වන Lee Chong Wei පරාජය කර තිබේ. ලිං තැන්ගේ විශාලතම ප්‍රතිමල්ලවයා ඔහුමයි. ලිං තැන් වැඩියෙන් කතා කිරීමට අකමැතිය. ඔහු හැම විටම සැලකිලිමත් ලෙෂ වැඩ කටයුතු කරමින් සිටියි. බැඩ්මින්ටන් ක්‍රීඩකයෙක් වශයෙන් ලිං තැන් අද්භූත දේ බොහෝමයක් නිර්මාණය කර තිබේ. බැඩ්මින්ටන් ක්‍රීඩාවක සියලූම තරඟ දිනා ගත් ක්‍රීඩකයෙක් වන ලිං තැන් තමාට අභියෝග කිරීම සඳහා තරඟයට සහභාගි වනු ඇත.






ඉදිරිපත් කිරීම : බූ යුන්

# චීනය එක් දරු ප්‍රතිපත්තියට සමු දෙයි



ඉදිරිපත් කිරීම : ෂෙං ලී

චීනය දැවැන්ත රාජ්‍යයක් බවට පත් ව ඇත්තේ පසුගිය දශක කීපයේදී ලෝකයා ඉදිරියේ ප්‍රදර්ශනය වූ ආර්ථික, දේශපාලන, සංස්කෘතික හා සාමජයීය ප්‍රගතිය හා ප්‍රබලතාව පමණක් නොව, එහි වෙසෙන කෝටි 130ක ජනගහණය නිසා බව පොදු පිළිගැනීමකි.

පසුගිය 50 දශකයේ චීන කොමියුනිස්ට් පක්ෂයේ පාලනය යටතේ බිහි වූ නව චීනය අතිමහත් ජාතික සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කළේ ය. ඊට අවශ්‍ය විශාල ශ්‍රම බලකාය වෙනුවෙන් රජය ජනගහණ ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළේ ය. එම කාලයේ දරුවන් වැඩියෙන් බිහි කළ මවකට වීර මාතාව යන ගෞරව නාමය පිරිනමනු ලැබීය. නමුත් මේ තත්වය යටතේ 60 දශකයේ සිට අධික වන ජනගහණය නිසා විවිධ ගැටළු හා පීඩන දිනෙන් දින ඉස්මතු විය.

ලොව අධිකතම ජනගහණයට හිමිකම් කියන මේ දැවැන්ත රාජ්‍යය පසුගිය 70 දශකයේ සිට විශේෂ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ආරම්භ කළේ ය. එක් දරු ප්‍රතිපත්තිය නමින් හැඳින්වෙන එම ජනගහණ පාලන ක්‍රමය එතැන් සිට චීනයේ මූලික ජාතික ප්‍රතිපත්තියක් ලෙසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලැබිණ. ඒ අනුව චීනයේ නාගරික යුවළකට හදා වඩා ගත හැක්කේ එක් දරුවකු පමණි. ග්‍රාමීය යුවළකගේ පළමු දරුවා දැරියක් වුවහොත් එම පවුලට තවත් දරුවෙකු ලැබීමේ අයිතිය හිමි වේ.

'වැඩි දරුවන්, වැඩි සැප' යනු චීනයේ සාම්ප්‍රදායික මතයකි. දරු සම්පත චීන ජාතිකයන් හැම විට ම අගය කරන්නකි. එබැවින් එක් දරු ප්‍රතිපත්තිය හා දරු සම්පත් සරු කිරීම අතර ඇති සම්බන්ධය ජනතාවට අවබෝධ කර දීම චීන රජය මුහුණ දුන් දැඩි අභියෝගයක් විය. ගත වූ වසර 30ක පමණ කාලයේ කෝටි 40ක ජනගහණයක් බිහි වීම වැළැක්වීමට චීනය සමත් ව තිබේ. එය එක් දරු ප්‍රතිපත්තියේ විශාලතම ජයග්‍රහණය ලෙස සැලකේ.

එහෙත් කාලයාගේ ඇවෑමෙන් චීන ආර්ථික හා සමාජීය සංවර්ධනයත් අවම මට්ටමේ දරු උපත් අනුපාතයත් වියපත් ජනගහණය වැඩි වීමත් අතර පවතින ගැටුම් තව තවත් උග්‍ර වී ඇත. චීනය අද ලොව වැඩි ම ජනගහණය සතු වුව ද දශක 30කට වැඩි කාලයක් පුරා ක්‍රියාත්මක වන එක් දරු ප්‍රතිපත්තිය හේතුවෙන් අව මට්ටමේ දරු උපත් අනුපාතය, වියපත් ජනගහණය හා නාගරික



ජනගහණය වර්ධනය වීම සහ එක් දරු පුවල් සංඛ්‍යාව වැඩි වීම වැනි ජනගහණ ගැටළු චීනය තුළ මතු වී තිබේ. සංඛ්‍යා ලේඛනවලින් හෙළි වූ තොරතුරුවලට අනුව 2014 වසරේ චීනයේ වයස අවුරුදු 15ත් 59ත් අතර වන ශ්‍රම ජනගහණය කෝටි 93ක් දක්වා අඩු වී ඇත. එමෙන් ම වයස අවුරුදු 60කට වැඩි වියපත් පුද්ගලයන් සංඛ්‍යාව කෝටි 21ක් දක්වා වර්ධනය වී තිබේ. ඒ තුළින් ඇති වන ශ්‍රම, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ ප්‍රශ්න තවදුරටත් බරපතල වනු ඇති බවට අනතුරු ඇඟවී ඇත. මෙවන් ගැටළුවලට මුහුණ දෙමි-න් 2013 වසරේ චීන රජය එක්දරු ප්‍රතිපත්තියට වෙනසක් කළේ ය. ඒ වෙනසට අනුව අඹුසැමි දෙ-දෙනා සිය පවුලේ එකම දරුවා වී තිබිණි නම් ඒ යුවළට දරුවන් දෙදෙනෙකු බිහි කළ හැකි විය.

පසුගිය ඔක්තෝබර් මාසයේ බෙයිජිං අගනුවර පැවති චීන කොමියුනිස්ට් පක්ෂයේ 18වැනි මධ්‍යම කාරක සභාවේ 5වැනි පූර්ණ සැසිය රටේ ඉදිරි සංවර්ධනය පිළිබඳ පුළුල් අන්දමේ සැලැසුම් සම්පාදනය කළේ ය. ඒ අතරින් පවුල් සංවිධානය සඳහා ගත් අලුත් ම තීරණය වඩාත් කැපී පෙ නුණි. එම තීරණයට අනුව, එක් දරු ප්‍රතිපත්ති වෙනුවට දෙදරු ප්‍රතිපත්තිය එනම් එක් පවුලකට දරුවන් දෙදෙනකු හදා ගැනීමේ අයිතිය ලබා දීමේ ප්‍රතිපත්තිය රජය අනුගමනය කරනු ඇත. මෙම අලුත් පවුල් සංවිධාන ප්‍රතිපත්තිය හරහා චීනයේ වත්මන් ජනගහණ ව්‍යුහය වඩාත් යහපත් කිරීම ශ්‍රම බලකාය වැඩි කිරීම, වියපත් ජනගහණයෙන් ඇති වන පීඩන අවම කිරීම සහ චීන ආර්ථි ප්‍රබලතාව ඉහළ නංවාලීම අපේක්ෂා කළ හැකි බව චීන ජාතික සෞඛ්‍ය හා පවුල් සංවිධාන කොමිසමේ ප්‍රධානියා පවසා තිබේ.

වසර 2020 වන විට සශ්‍රීක සමාජයක් ගොඩ නැගීම සහ වසර 2050 වන විට චීනය සමෘද්ධිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී රටක් බවට පත් කිරීම යනු චීනයේ පරම ඉලක්ක දෙකයි. එක් දරු ප්‍රතිපත්තියට සමු දීම වත්මන් චීන සමාජ තත්ව සහ එම පරම ඉලක්ක දෙක අරමුණු කරමින් ගත් නිවැරදි තෝරා ගැනීමක් බව පොදුවේ පිළි ගැනේ



# ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය



නැගෙනහිරදිග චීනයේ ශන්හැයි නගරය එහි ආර්ථිකය හේතුවෙන් ලොව පුරා ප්‍රකට වූ නගරයකි. මීට අමතරව විශිෂ්ට විශ්ව විද්‍යාල රැසක් සතුවීම ද එහි විශේෂත්වයකි. ඒ අතරින් ප්‍රකට ම එකක් වන්නේ ශන්හයි ජයෝතුං විශ්ව විද්‍යාලයයි.

වසර 1896දී ඉදි කෙරුණු ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය චීනයේ ඉපැරණි ම විශ්ව විද්‍යාලයකි. එය චීනයේත් ලෝකයේත් කීර්තිනාමයක් ලැබුවේ එහි තිබෙන ඉහළ අධ්‍යාපන මට්ටමක් නිසාවෙනි. චීනයේ හොඳ ම විශ්ව විද්‍යාල පිළිබඳ ලේඛනයේ ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය ඉහළ ස්ථානයක් ගනී.

ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා වාර්ෂික ව චීනය පුරා විශිෂ්ට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විශාල පිරිසක් දැඩි තරගකාරීත්වයකින් යුතුව ක්‍රියා කරති. රට පුරා විශිෂ්ට ශිෂ්‍යයන් ඒක්රැස්වීම හේතුවෙන් වාර්ෂික ව ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය සමාජයට විශිෂ්ට උපාධිධාරීන් විශාල පිරිසක් සපයා දෙයි. එසේ බිහි වූ අය අතරින් බොහෝ දෙනෙක් පසුව චීනයේ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් බවට පත් වූහ. චීනයේ හිටපු ජනාධිපති ජ්‍යාං ස මින් මහතා ද මෙම විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. ඊට අමතරව, චීනයේ උසස් ම පෙළේ විද්‍යාඥයෝ 20කට අධික පිරිසක් ද ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලයේ ඉගෙනීම් හා පර්යේෂණ කටයුතුවල නිරත වී සිටිති. ඒ නිසා චීනයේ සංවර්ධනය හා සමෘද්ධිය වෙනුවෙන් ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය මනා පිටුබලයක් බව සඳහන් කළ හැකි ය.

ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලය චීනයේ විශ්ව විද්‍යාල අතරින් විශිෂ්ට ඉන්ජිනේරු අධ්‍යාපනයක් නිසා ප්‍රකට ය. එහි ඇති පීඨ 28ක් අතරින් විද්‍යුත් ඉන්පිනේරු, වෛද්‍ය විද්‍යාව, නෞකා ඉන්පිනේරු වැනි විෂයයන් වඩා ජනප්‍රිය ය. චීනයේ ප්‍රථම චන්ද්‍රිකාව, රොකට්ටුව සහ ජෙට් යානාව නිර්මාණය කිරීමට ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලයේ තාක්ෂණිකයෝ දායකත්වය ලබා දූහ. චීනයේ නැව් තැනීම් ක්ෂේත්‍රයේ බොහෝ ප්‍රවීණයෝ එහි නෞකා ඉන්පිනේරු පීඨයේ උපාධිධාරිහු වෙති.

මේ වන විට, ශන්හැයි ජෙයෝටුං විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ගේ සංඛ්‍යාව 2800 ඉක්මවා ගොස් ඇත. ඒ අතරින් 800කට වැඩි පිරිසක් ආචාර්ය උපාධි

ලබා ගත් අය වෙති. එමෙන් ම, ශිෂ්‍යයන් දහස-යදහසකට අධික පිරිසක් එහි සිටිති. ඒ අතරින් රටවල් 100කට වැඩි ප්‍රමාණයකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ පිරිසක් සිටීම විශේෂත්වයකි.


මෑත කාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම පිණි ස චීනයට පැමිණි විදේශ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙයි. මෙවැනි පසුබිමක් යටතේ, ශන්හැයි ජෙය්ටුං විශ්ව විද්‍යාලය වැනි චීනයේ ඉහළ ම පෙළේ විශ්ව විද්‍යාල විදේශ ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් ඇද ගනී. මේ වසරේ ශන්හැයි ජෙය්ටුං විශ්ව විද්‍යාලයේ අංශ රැසක් විදේශ ශිෂ-ෂ්‍යයන් බඳවා ගනී. සාමාන්‍ය උපාධිය සඳහා විදේශ ශිෂ්‍යයෙකුට මෙහි අවුරුදු 4ක් ඉගෙන ගැනීමට අවශ්‍ය ය. ඉදිකිරීම්, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් සඳහා අවුරුදු 5ක් අවශ්‍ය ය. ගුරුවරුන් බහුතරය චීන ජාතිකයන් වීම නිසා සාමාන්‍යයෙන් ශිෂ්‍ය යන්ට උගන්වනු ලබනුයේ චීන භාෂාවෙනි. ඒ නිසා විදේශ ශිෂ්‍යයන් පැමිණි මුල් කාලයේදී චීන භාෂාව අධ්‍යයනය කළ යුතු ය. එහෙත්, ඉන්ග්‍රීසි භාෂාවෙන් ද ඉගැන්වීම් කටයුතු සිදු වෙයි. පශ්චාත් උපාධිය සඳහා සාමාන්‍යයෙන් අවුරුදු 2, 3ක් ගත වෙයි. ආචාර්ය උපාධිය සඳහා අවුරුදු 4ක් අවශ්‍ය ය.

නිල උපාධි අධ්‍යාපනයට අමතරව, කෙටිකාලික පුහුණු සහ හුවමාරු අධ්‍යාපන වැඩසටහන් ද ශන්හැයි ජෙය්ටුං විශ්ව විද්‍යාලය සපයයි. ඒවැනි අධ්‍යාපනයක් ලබන විදේශ ශිෂ්‍යයෝ සාමාන්‍යයෙ-යන් මෙහි අවුරුදු 1, 2ක් පමණ සිටිති. ඔවුන්ට උපාධිය වෙනුවට සහතික පත්‍රයක් හිමි වෙයි.

ශන්හැයි ජෙය්ටුං විශ්ව විද්‍යාලයට ඉතා විශිෂ්ට පහසුකමක් හිමි වෙයි. පන්ති කාමර, නේවාසික කාමර විශාල ප්‍රමාණයකට අමතරව, ක්‍රීඩාංගන කිහිපයක් ද එහි තිබේ. ඒ අතරින් ප්‍රෙක්ෂකයන් දෙදසදහසක් පමණ පිරිසකට පහසුකම් සැලකිය හැකි ක්‍රීඩා සංකීර්ණයක් ද තිබේ. පිහිනුම් තටාක කිහිපයක් ද එහි ඇත. ඊට අමතරව, ඒ ඒ ක්-ෂේත්‍ර පිළිබඳ පොත්පත්, ලිපිලේඛන මිලියන 3කට ආසන්න සංඛ්‍යාවක් සහිත නවීන පුස්තකාලයක් ද එහි ඇත. එහි බිම්සරිය වර්ග මීටර් මිලියන 6කට අධික ය. ඒ නිසා ජීවිතය සහ අධ්‍යාපනය පිළිබඳව ඔබට එහි පහසුවක් ලැබෙයි.

ශන්හැයි ජෙය්ටුං විශ්ව විද්‍යාලය පිළිබඳ වැඩිපුර තොරතුරු සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.


www.sjtu.edu.cn



ඉදිරිපත් කිරීම : හැන් ජ්යැන්









# 《每日汉语》එදිනෙදා චීන බස

## 爱好 විනෝදාංශ

### 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你最近忙吗？ | නී ස්වේ පින් මං මා ?<br>ඔයාට මේ දවස්වල වැඩ වැඩියි ද? |
| 你的爱好是什么？ | නී ද යෛයි හඕ ෂ ෂෙන් ම ?<br>මොනවා ද ඔයාගේ විනෝදාංශ? |
| 我喜欢看书。 | වෝ ෂි හුඇන් කැන් ෂූ.<br>මම ආසයි පොත් කියවන්න. |
| 周末你一般干什么？ | චෝඕ මො නී යී බැන් ගැන් ෂෙන් ම ?<br>ඔයා සාමාන්‍යයෙන් සතිඅන්තයේ මොනව ද කරන්නේ ? |

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 你最近忙吗？ | නී ස්වේ පින් මං මා ?<br>මේ දවස්වල වැඩ වැඩියි ද? |
| 我很忙。 | වෝ හෙන් මං.<br>හරිම වැඩ වැඩියි. |
| 忙什么？ | මං ෂෙන්ම ?<br>ඒ මොකද ? |
| 工作。 | ගුං සුඕ.<br>වැඩ නේ. |

#### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 你的爱好是什么？ | නී ද යෛයි හඕ ෂි ෂෙන් ම ?<br>මොනවා ද ඔයාගේ විනෝදාංශ ? |
| 我喜欢看书。 | වෝ ෂි හුඇන් ක්ඇන් ෂූ.<br>මම ආසයි පොත් කියවන්න. |
| 你呢？你的爱好是什么？ | නීන ? නී ද යෛයි හඕ ෂි ෂෙන් ම ?<br>එතකොට ඔයා ගේ ? |
| 我喜欢旅游。 | වෝ ෂි හුඇන් ලයු යෝ.<br>මම ගමන් යන්න ආසයි. |

#### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 周末你一般干什么？ | චෝඕ මො නී යී බැන් ගැන් ෂෙන් ම ?<br>ඔයා සාමාන්‍යයෙන් සතිඅන්තයේ මොනව ද කරන්නේ ? |
| 打网球。 | දා වං චියුචි.<br>ටෙනිස් ගහනවා. |

**චීන සංස්කෘතියෙන් බිඳක්**

චීන කියමනක් තියෙනවා මිනිසෙකුට මුහුණක් ඇත්තේ ගසකට පොත්තක් ඇති සේමයි කියලා. මේ කියමනේ අදහස මිනිසාට ලැජ්ජාව දැනෙනවා කියන එකයි. චීන මියැන් චි ගැන දක්වන්නේ ලොකු අවධානයක්. මියැන් චි කියන එකේ සෘජු තේරුම නම් පිටත කොටස හරි මුහුණ වගේ දෙයක්. නමුත් එම පදයේ ගැඹුරු අරුත නම් කීර්තිය හෝ නම්බුව කියන එකයි. ඉතා දිගු කලක් තිස්සේ චීනයට අනුබල සැපයූ කොන්ෆියුසියස් දර්ශනයේ උගන්වෙන ජනතා සන්නිවේදනයේ මූලික නියමයක් වන සුසංගත භාවයෙහි වටිනාකමෙහිද මේ සම්බන්ධයෙන් යමක් දැක්වෙනවා. යහපත් සුසංගත සබඳතා පවත්වා ගැනීම සඳහා වන හොඳම විධිය ලෙස අන් අය ප්‍රසිද්ධියේ අපහසුතාවට ලක් වීමෙන් ඔවුන්ගේ මුහුණේ ඉරියව් වෙනස් වීම් වලින් බේරා ගත යුතුයි යන්නයි එහි දැක්වෙන්නෙ. මීට අමතරව කොන්ෆියුසියස් දර්ශනයෙහි කියැවෙන්නේ මිතුරන් එකට ජීවත්වී එකට මිය යා යුතු බවයි. මිතුරන් අතින් පවා වැරදි සිදු වෙනවා. ඒ වැරදි අනෙක් පුද්ගලයන් ඉදිරියේ පෙන්වීම නොකළ යුතුයි. මෙය චීන ජනතාව යමෙකු ප්‍රසිද්ධියේ අපහසුතාවට පත්වීම වැළැක්වීමට හුරුවීමක් මෙන්ම මිනිස් සබඳතා සුමට කිරීමේ යහපත් ගුණාංගයක් ලෙසත් සලකනවා.

# 《每日汉语》එදිනෙදා චීන බස

## 在快餐店 ක්ෂණික ආහාර අවන්හලකදී

### 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你想吃什么？ | නී ෂිඅන් චී ෂෙන්ම?<br>ඔයා කන්න කැමති මොනව ද? |
| 我要一个汉堡，还有一杯红茶。 | වෝ යොව් යීග හැන් බෝ, හැයි යුඕ යී බෙයි හොං චා.<br>මට හැම්බර්ග් එකක් ඕන, තව රතු තේ කෝප්පයකුත් ඕන. |
| 在这儿吃还是带走？ | සයි චර් චී හැයි ෂි දැයි ත්ස්ඕ?<br>මෙහිදී කෑම කනවා ද එහෙම නැතිනම් අරන් යන්න ද? |
| 请问，洗手间在哪儿？ | සයි චිං වෙන්, ෂි ශඕ පියැන් ස්යි නාර් ?<br>සමාවෙන්න, කොහෙද වැසිකිළිය ? |
| 请你给我几张餐巾纸。 | චිං නී ගේ වෝ පි චං සැන් පින් චර්.<br>කරුණාකර මට අත පිහිදන කඩදාසි කිහිපයක් දෙන්න. |

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 你想吃什么？ | නී ෂිඅන් චී ෂෙන්ම?<br>ඔයා කන්න කැමති මොනවද? |
| 我要一个汉堡，还有一杯红茶。 | වෝ යොව් යීග හැන් බෝ, හැයි යුඕ යී බෙයි හොං චා.<br>මට හැම්බර්ග් එකක් ඕනී තව රතු තේ කෝප්පයකුත් ඕන. |

#### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 在这儿吃还是带走？ | සයි චර් චී හැයි ෂි දැයි ත්ස්ඕ?<br>මෙහිදී කෑමට ද නැතිනම් අරන් යන්න ද ? |
| 在这儿吃。 | සයි චර් චී .<br>මෙහිදී කන්නවා. |

#### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 请问，洗手间在哪儿？ | චිං වෙන්, ෂි ශඕ පියැන් ස්යි නාර් ?<br>සමාවෙන්න, වැසිකිළිය කොහෙද ? |
| 往前走，左拐。 | වාං චියැ ච්ඕ, ත්සුවෝ ගුවෛයි.<br>ඉස්සරහට ගිහින් වන්ම පැතට යන්න. |

#### 对话 四 හතරවන සංවාදය

| | |
|---|---|
| 请你给我几张餐巾纸。 | චිං නී ගේ වෝ පි චං සැන් පින් චර්.<br>කරුණාකර මට අත පිහිදන කඩදාසි කිහිපයක් දෙන්න. |
| 好的，您稍等。 | හාඕ ද, නීන් ශෝ දන්ග්.<br>හරි පොඩ්ඩක් ඉන්න. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

බටහිර ක්ෂණික ආහාර අවන්හල් වලට සාපේක්ෂව චීන ක්ෂණික ආහාර අවන්හල් සංවර්ධන වෙන්න පටන් ගත්තේ බොහෝ ප්‍රමාද වෙලායි. නූතන ක්ෂණික ආහාර අවන්හල් සංකල්පය චීනයට හඳුන්වා දුන්නේ Kentucky Fried Chicken (KFC) අවහල් ශාඛාවක් පළමු වරට 1987 වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ කිරීමත් සමයයි. අනෙක් කාර්ණය චීන ජාතිකයන්ගේ ආහාර පාන පුරුදු බටහිර ජාතිකයන්ට වඩා බොහෝ වෙනස් වීමත් මෙයට බලපෑවා. සාමාන්‍යයෙන් චීන ජාතිකයන් අවන්හලකට ගොස් බොහෝ ප්‍රණීත අහාර පාන රැසක් ඇණවුම් කොට සතුටු සාමීච්යේ යෙදෙන අතරතුර ඒවා එකවර රස විඳින්නයි පුරුදුවී සිටින්නේ. චීන ක්ෂණික ආහාර අවන්හල් කර්මාන්තයේ සංවර්ධනය තවමත් තියෙන්නේ මූලික අවධියක. තවම එය මහා පරිමාණ කර්මාන්තයක් බවට පත් වෙලා නැහැ. එහෙත් වෙරළාසන්න, උප සහ මහා නගරවල ජීවත් වෙන සිසුන්ට, පිටතින් අහාර ලබාගන්න අයට නම් ක්ෂණික ආහාර අවල්හල් කියන්නේ අත්‍යවශ්‍ය තේරීමක්. මෙවැනි චීන නගරවලදී දැන් ඔබට ඉතාම පහසුවෙන් ණාපක හෝ එජෑදබ්ක්ෆී වැනි ක්ෂණික ආහාර අවන්හල් සොයා ගත හැකියි. ඒ වගේම නානාවිධ චීන ක්ෂණික ආහාර අවන්හල් ද දැන් බිහිවී තිබෙනවා. ඉතා කාර්යබහුල නවීන ලෝකයේ ජීවත්වන ජනතාවට මෙවැනි අවන්හල් වලින් සැපයෙන්නේ ඉමහත් සේවයක් බව නම් කිව යුතුයි.

# ලයිසියම් ජාත්‍යන්තර පාසලේ චීන සංස්කෘතික ව්‍යාපෘතිය








ගම්පහ ලයිසියම් ජාත්‍යන්තර පාසලේ 2 D පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම පාසල් ව්‍යාපෘතිය ලෙස තෝරා ගනු ලැබුවේ ආසියාවේ විශාලතම රට වන චීනයයි. චීනයේ සාම්ප්‍රදායික උත්සව, නර්ථන කලාව, ඇඳුම් වර්ග, කෑම් වර්ග ආදිය පිළිබඳව ඔවුන් ලබා ගත් දැනුම ඉදිරිපත් කළ ආකාරය සිත් ගන්නා සුළු ය. දැනුම, ආකල්ප, කුසලතා යන අංශ තුනෙන්ම දරුවන්ට දැනුම ලබා දීම සඳහා මෙවැනි ව්‍යාපෘතිය සංවිධානය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ශිෂ්‍යයන් හා ඔවුන්ගේ දෙමව්පියන්ගේ දැඩි ප්‍රසාදයට පත් වී තිබේ.



















# සුභාසර සඟරා ප්‍රදානය

සුභාසර සඟරාව මාතලේ සාන්ත තෝමස් විදුහලට භාරදීම එම විද්‍යාලයේදී සිදු කෙරිණි. පින්තූරයේ දැක්වෙන පරිදි මාතලේ සාන්ත තෝමස් විද්‍යාලයේ විදුහල්පති දම්පිය වනසිංහ මහතාට, මාතලේ රතු කුරුස සමාජයේ විධායක සභික එරික් හුලංගමුව මහතා විසින් භාරදුන් අවස්ථාව. මෙම සඟරා කිහිපයක් එම විද්‍යාලයේ පුස්තකාලයට හා අ.පො.ස. උසස් පෙළ කරන සිසුන් අතර බෙදා දෙන ලදි. මෙහිදී විශේෂයෙන්ම සුභාසර පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සඟරාවේ ඇති ඉල්ලුම්පත් අදාල ලිපිනයට යොමු කරන මෙන් ශිෂ්‍යයන්ට දැන්මු දෙන ලදි.

# මින්ට් සහිත ලෙමන් යුෂ




## අවශ්‍ය ද්‍රව්‍ය

- මින්ට් කොළ ස්වල්පයක්,
- ලෙමන් ගෙඩියක්,
- පැණි ස්වල්පයක්

## සාදන ක්‍රමය

- මින්ට් කොළ හෝදන්න.
- ලීටර් 1ක ප්‍රමාණයක ශීත වතුරට මින්ට් කොළ යොදන්න, පැයක් පමණ පොඟවන්න.
- ලෙමන් ගෙඩිය රවුම් ලෙස කැබලිවලට කපන්න.
- එම ලෙමන් කැබලි මින්ට් වතුරට දමා විනාඩි 30ක් පමණ පොඟවන්න.
- පැණි සුදුසු ප්‍රමාණයක් ඒ මිශ්‍රණයට දමන්න.
- හොඳින් හැඳි ගන්න. අවසානයේදී එය වඩා ප්‍රණීත ලෙස පිළිගැන්වීම සඳහා එයට අයිස් කැට කිහිපයක් එක් කරන්න.



ඉදිරිපත් කිරීම : වං යිං

# අමු මිරිස් සහිත අල තීරු





## අවශ්‍ය ද්‍රව්‍ය

- අල ගෙඩි 2ක්
- අමු මිරිස් කරල් 3ක්
- ගම් මිරිස් සුදුසු ප්‍රමාණයක්
- තෙල් අවශ්‍ය ප්‍රමාණයට
- ලුණු සුදුසු ප්‍රමාණයක්
- සීනි ස්වල්පයක්
- විනාකිරි ස්වල්පයක්

## සාදන ක්‍රමය

- අල සෝදා පොතු ඉවත් කරන්න.
- ඉන් පසුව අල ගෙඩි ඉතා සිහින් තීරුවලට කපන්න, අලවල පිෂ්ටය ඇති නිසා තීරුවලට කැපීමෙන් පසු වතුරින් පොඟවීමට අවශ්‍යයි. එවිට පිෂ්ටය ඉවත් වන අතර කපා ගත් අල තීරු විනාඩි 5ක් පමණ එලෙස වතුරින් පොඟ වා ගෙන මිරිකා වතුර ඉවත් කර ගන්න.
- ඉන් අනතුරුව අමු මිරිස් කුඩා තීරුවලටත් කපන්න.
- තෙල් සුදුසු ප්‍රමාණයක් තාච්චියට දමා රත් වීමෙන් පසු එයට ගම් මිරිස් දමන්න. එහි සුවඳ එන විට කලින් කපා සකසා ගත් අල තීරු තාච්චියට දමා බදින්න.
- ඉන් පසු විනාකිරි ස්වල්පයක්, ලුණු හා සීනි එයටම එක් කරන්න.
- විනාඩියකට පමණ පසු කපනු ලැබූ අමු මිරිස් තීරු තාච්චියට දමා පෙර ලෙසම බැද ගන්න.
- වඩාත් ක්‍රිස්පි ලෙස අල තීරු අනුභව කිරීමට කැමති නම් වැඩිපුර කලින් විනාකිරි යොදා ගන්න. එසේ නොමැතිනම් පසුව විනාකිරි එක් කරන්න. අකමැතිනම් විනාකිරි එක් නොකිරීමටද හැකියි.

# හතරවන ලෝක බෞද්ධ සමුළුව

හතරවන ලෝක බෞද්ධ සමුළුව පසුගිය ඔක්තෝබර් මස 24 සහ 25 යන දිනයන්හීදී චීනයේ වුෂී නගරයේ පැවැත්විය. චීන බෞද්ධ සංගමය චීන ආගමික සහ සංස්කෘතික සන්නිවේදන සංගමය මෙය සංවිධානය කර තිබේ.

මෙහි තේමාව වූයේ සාමූහික ක්‍රියාවලිය බෞද්ධ හුවමාරු වැඩසටහන් වල අධ්‍යයනයේ වැදගත්කම ලෝකයේ ස්ථිරසාර සාමය සහ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීමෙන් බෞද්ධ දර්ශනයේ වැදගත්කම හුවාදැක්වීමයි. මේ සඳහා ශ්‍රී ලංකාවෙන් දූත පිරිසක් සහභාගීවූ අතර සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක ගලගම ශ්‍රී අත්තදස්සී නාහිමි ප්‍රමුඛ සංඝරත්නයද ගිහි පාර්ශවය වෙනුවෙන් නියෝජ්‍ය අමාත්‍ය මිත්‍රපාල මැතිතුමාද බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ආචර්ය ප්‍රගීත් අබේසුන්දර ඇතුළු පිරිසක් සහභාගී විය.





# නිෂ්පූරණය හඳුනා ගැනීම සහ උගුරේ යමක් සිරවීමකදී ප්‍රථමාධාර

මිනිසෙකුගේ සිරුරේ ක්‍රියාකාරීත්වය සඳහා ශක්තිය නිශ්පාදනය කිරීමට නම් සෛල වෙත ග්ලූකෝස් සහ ඔක්ෂිජන් ළඟා විය යුතුය. අප ගන්නා ආහාර පාන මගින් සිරුරට අවශ්‍ය ග්ලූකෝස් ශරීරගත වී රුධිරය මගින් ඒවා සෛල වෙත ගෙන යනු ලබයි. ඔක්ෂිජන් සිරුර වෙත ලබා ගන්නේ ස්වසන ක්‍රියාවලිය මගිනි. ඔක්ෂිජන් නිසි පරිදි ශරීරගත වීම සඳහා යහපත් ස්වසනය ක්‍රියාවලියක් සිදුවිය යුතු අතර ඒ සඳහා පහත සඳහන් තත්ත්වයන් සම්පූර්ණ වී තිබිය යුතු වේ.

- **ස්වසන මාර්ගය අවහිර නොවී තිබීම**

(උගුරේ යමක් සිරවීම, ගෙල සිරවීම, දියේ ගිලීම, නාසය හා මුඛය එකවිට වැසී යාම, නාසයේ යමක් සිරවීම ආදී අවස්ථාවල මෙන්ම ඇදුම, අසාත්මිකතා වැනි රෝගී තත්ත්වයන් නිසා ද ස්වසන මාර්ගය අවහිර විය හැකිය)

- **ස්වසන පාලන කෙන්ද්‍රස්ථානයට හෙවත් සුසුම්නා ශීර්ෂකයකට හානි නොවී තිබීම**

(විදුලි සැර වැදීම, හිස පිටුපසට තදබල පහරක් වැදීම හෝ තුවාල වීම, වස විෂ ශරීරගත වීම, මොළයේ ඇතිවන රෝගී තත්ත්වයන්වලදී සුසුම්නා ශීර්ෂකයට හානි සිදු විය හැකිය)

- **ස්වසන යාන්ත්‍රණයට හෙවත් ස්වසනය සිදුවීමට උදව්වන අවයවයන්ට හානි හෝ බාධා නොවී පැවතීම**

(තුවාල, හග්න, පිළිස්සීම වැනි පපු ප්‍රදේශයට සිදුවන අනතුරු, පපු ප්‍රදේශය අධික ලෙස තෙරපීම, නියුමෝනියාව, පෙනහළු පිළිකා වැනි රෝගී අවස්ථාවලදී ද මෙයට බාධාර විය හැකිය.)

- **ස්වසනය කරන අවට පරිසරයේ ඔක්ෂිජන් පැවැතීම**

(ගෑස් හෝ දුමාරයකින් වට වී ඇති විට, පතල් තුළදී, විශාල ගින්නක් පැතිරී ඇති විටක අවට ප්‍රදේශයේ, උඩු ගුවනේදී, කන්ටේනර් තුළදී, රසායනාගාර තුළදී, විෂ-වායු පැතිරුණු ස්ථානයකදී අවට පරිසරයේ ඔක්ෂිජන් අඩු විය හැකිය.)

- **පටක වෙත ඔක්ෂිජන් අවශෝෂණය කර ගැනීමට නොහැකි වීම**

කාබන් මොනොක්සයිඩ් විෂ වීම, සයිනයිඩ් විෂ වැනි අවස්ථාවලදී අවට පරිසරයේ ඔක්සිජන් සීමා විය හැකිය.

ඉහත සඳහන් එක් අංගයක් හෝ සම්පූර්ණ නොවුවහොත් පුද්ලයෙකුගේ සිරුරට අවශ්‍ය කරන ඔක්ෂිජන් පටක/ සෛල වෙත ගෙනයාමට නොහැකි වේ. එවිට ඇතිවන රෝගී තත්ත්වය නිශ්පූර්ණය (Hypoxia) වේ. ඒ අනුව නිශ්පූර්ණය යනු සිරුරේ පටකවලට අවශ්‍ය කරන ඔක්ෂිජන් සහිත රුධිරය නොලැබී යාම නිසා ඇතිවන තත්ත්වයි. වේගවත් කෙටි ස්වසනය, දුර්වල ස්වසනය, කතා කිරීමේ අපහසුව, ව්‍යාකූලතාවය හා සිහි මද බව, නොසන්සුන් බව, හිසරදය, වමනය, දුර්වල නාඩි, සිහි නැති වීම, සම හෝ සිරුරේ අග කොටස් නිල්පැහැ ගැන්වීම වැනි රෝග ලක්ෂණ හා නිමිති නිෂ්පූර්ණයෙහිදී දක්නට ලැබේ. මෙහිදී නිෂ්පූර්ණය ඇතිවීමට බලපාන ලද අවස්ථාව අනුව අදාළ ප්‍රථමාධාර වහාම ලබා දිය යුතුය.

මෙම පාඩමෙන් උගුරේ යමක් සිරවීමකදී සිදු කරන ප්‍රථමාධාර දැනගනිමු.

## වැඩිහිටියකුගේ උගුරේ යමක් සම්පූර්ණයෙන් සිරවීමකදී ප්‍රථමාධාර

රෝගියා අස්වැසෙන පරිදි කතා කරන්න. උදව් කිරීමට අනුමැතිය ඇත්දැයි බලන්න. මුඛයෙහි පෙනෙන පරදි සිරවී ඇත්නම් ඉවත් කරන්න. නැතිනම් පහත පියවර අනුමනය කරන්න.

01. Coughing – **රෝගියාට කහින ලෙස උපදෙස් දෙන්න. පිටතට පෙනෙන පරිදි මුඛයේ සිරවී ඇත්නම් ඉවත් කරන්න.**

02. Back Blows - **පිට අත්පහර 05 ක් දෙන්න**

රෝගියා සිට ගැනීමට සලස්වා උරහිස් පෙදෙස ඉදිරියට නමා එක් අතකින් රෝගියා ඉදිරියට තල්ලුවීම වැළකෙන සේ රඳවාගෙන අනෙත් අතින් උරපතු අතර මැදට සාමාන්‍ය පරිදි 05 වරක් තට්ටු කරන්න.



**03. Abdominal Thrusts – උදර තෙරපුම් වාර 05 ක් දෙන්න**

පිට අත් පහරින් ඉවත් නොවුයේ නම්, රෝගියාගේ පිටුපසින් සිට මිටි කරන ලද ඔබගේ දෑත් රෝගියාගේ නාභියත් පපු අස්ථියත් අතරට තබා උදරය ඉහළට 05 වරක් තෙරපන්න.

**04. Repeat – නැවත පෙර පරිදි කරන්න**

ඉහත පරිදි ඉවත් නොවුයේ නම්, පිට අත් පහර හා උදර තෙරපුම් වාර සාමාන්‍ය පරිදි නැවත ලබා දෙන්න.

අසිහි තත්ත්වයට පත් වී ඇත්නම් ස්වසන මාර්ගය විවෘත කොට ස්වසනය හා රුධිර සංසරණය පිරික්සන්න. ස්වසනය කරයි නම් ආරක්ෂිත ඉරියව්වේ තබා රෝහල්ගත කරන්න. ස්වසනය නොකරයි නම් CPR අරඹන්න.



## ළදරුවෙකුගේ උගුරේ යමක් සම්පූර්ණයෙන් සිරවීමකදී ප්‍රථමාධාර

**01. Back Blows – පිට අත්පහර 05 ක් දෙන්න**

a රූපයේ පරිදි ළදරුවා ඔබගේ දෙපා මත තබා පිටට 05 වරක් තට්ටු කරන්න.

**02. Chest Thrusts – උදර තෙරපුම් වාර 05 ක් දෙන්න**

b රූපයේ පරිදි ළදරුවා උඩුබෙලි අතට තබා පපු අස්ථිය මත කෙළවරට ඔබගේ ඇඟිලි දෙකක් තබා ඉහළට 05 ක් වරක් තල්ලු කරන්න.

**03. Repeat – නැවත පෙර පරිදි කරන්න**

ඉහත පරිදි ඉවත් නොවුයේ නම්, පිට අත් පහර හා පපු තෙරපුම් වාර 05 බැගින් සාමාන්‍ය පරිදි නැවත ලබා දෙන්න.

අසිහි තත්ත්වයට පත් වී ඇත්නම් ස්වසන මාර්ගය විවෘත කොට ස්වසනය පිරික්සන්න. ස්වසනය කරයි නම් ආරක්ෂිත ඉරියව්වේ තබා රෝහල්ගත කරන්න. ස්වසනය නොකරයි නම් CPR අරඹන්න.

උගුරේ යමක් සිරවී ඇති නමුත් ස්වසනය කළ හැකි අවස්ථාවල ඉහත පියවරයන් අනුගමනය කරමින් අඛණ්ඩව ආගන්තුක දේහය ඉවත් කිරීමට උත්සාහ නොකළ යුතුය. එම රෝගීන් වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල්ගත කළ යුතුය.

ඉහත ප්‍රථමාධාර ක්‍රමශිල්ප විදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් CPR ලබා දීමට තරම් කිසිසේත්ම ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.



a රූපය



b රූපය



# Calender 2016

## JANUARY

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | | | 1 | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 |
| 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 |

## FEBRUARY

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 |
| 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |
| 29 | | | | | | |

## MARCH

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 |
| 28 | 29 | 30 | 31 | | | |

## APRIL

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | | | 1 | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 |
| 25 | 26 | 27 | 28 | 29 | 30 | |

## MAY

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| 30 | 31 | | | | | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |

## JUNE

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 |
| 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 |
| 27 | 28 | 29 | 30 | | | |

## JULY

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | | | 1 | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 |
| 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 |

## AUGUST

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 |
| 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |
| 29 | 30 | 31 | | | | |

## SEPTEMBER

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 |
| 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 |
| 26 | 27 | 28 | 29 | 30 | | |

## OCTOBER

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| 31 | | | | | 1 | 2 |
| 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 |
| 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |

## NOVEMBER

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 |
| 28 | 29 | 30 | | | | |

## DECEMBER

| Monday | Tuesday | Wednesday | Thursday | Friday | Saturday | Sunday |
|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 |
| 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 |
| 26 | 27 | 28 | 29 | 30 | 31 | |



# කාල සටහන

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
| --- | --- | --- | --- | --- | --- |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |




## සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..............................................................................................................................

ලිපිනය : ..............................................................................................................................

වයස : .............................................. පාසල : ..............................................................................

දුරකථන : .............................................. විද්‍යුත් ලිපිනය : ..............................................................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..............................................................................................................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 49.8/31.6/30.61/25.21 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ට් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විවිධාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中国国际广播电台
CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2373/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka